2020

වාර්ෂික වාර්තාව



ජාතික නිවාස සංවර්ධන අධිකාරිය

ග්‍රාමීය නිවාස සහ ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය,
කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය

වාර්ෂික වාර්තාව
2020

ග්‍රාමීය නිවාස සහ ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය,
කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

පටුන

සාමාන්‍යාධිකාරිතුමාගේ ප්‍රකාශය

1 **පොදු හැඳින්වීම**

අපගේ දැක්ම, මෙහෙවර, පරමාර්ථ	01
සංස්ථාපිත තොරතුරු	02
අධ්‍යක්ෂ මණ්ඩලය	03
සංස්ථාපිත කළමනාකරණය	04
ජාතික නිවාස සංවර්ධන අධිකාරිය දිස්ත්‍රික් කාර්යාල ජාලය	05 - 06
ප්‍රධාන ක්‍රියාකාරකම් වාර්තාකරණය	07 - 09

2 **සංස්ථාපිත පාලනය**

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම	10
විගණන හා කළමනාකරණ	10
මාසික ප්‍රගති සමාලෝචන රැස්වීම	10
අභ්‍යන්තර පාලනය	10
විධායක කළමනාකරණය	10
අවධානම් කළමනාකරණය	11 - 12
පාරිසරික ගැටළු	12
ආයතනයේ සංවිධාන ව්‍යුහය	13

3 **මෙහෙයුම් ක්‍රියාකාරකම් වාර්තාකරණය**

නිවාස සංවර්ධන කොට්ඨාශය	14 - 16
දේපළ කළමනාකරණ කොට්ඨාශය	16 - 17
ඉංජිනේරු සේවා හා ඉදිකිරීම් කොට්ඨාශය	18 - 22
මානව සම්පත් කළමනාකරණ කොට්ඨාශය	22 - 36
නීති අංශය	36 - 39
සැලසුම් හා ප්‍රගති කොට්ඨාශය	40 - 43
තොරතුරු හා ප්‍රචාරක කොට්ඨාශය	44

4 **මෙහෙයුම් ප්‍රතිඵල සමාලෝචනය**

අයකිරීම් ක්‍රියාකාරීත්වය	45 - 54
අභ්‍යන්තර විගණන අංශය	55
ඕෂන්වීව් ඩිවලොප්මන්ට් සමාගම	56 - 57

5 **මුල්‍යමය ප්‍රකාශන**

මුල්‍ය තත්ව ප්‍රකාශනය	58
මුල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය	59
ගිණුම් ප්‍රතිපත්ති	60 - 67
මුල්‍ය ප්‍රකාශනවල සටහන්	68 - 95

6 **විගණකාධිපති වාර්තාව** 96 - 106

සාමාන්‍යාධිකාරිතුමාගේ ප්‍රකාශය



ශ්‍රී ලාංකීය ජන සමාජයේ සෑම පුරවැසියෙකුටම නිවසක හිමිකම ලබාදීම උදෙසා මනා ලෙස සැලසුම්ගතව ක්‍රියාත්මක කරන ලද "ඔබට ගෙයක් රටට හෙටක්" වැඩසටහනේ කාර්යභාරය විධිමත් අයුරින් ඉටුකිරීමට දායකවූ අභියෝගාත්මක වසරක් ලෙස 2020 වසර හඳුන්වා දිය හැකිවේ.
විශේෂයෙන්ම අනපේක්ෂිතව ගෝලීය වසංගතයක් ලෙස ඇතිවූ කොවිඩ් 19 වසංගත තත්වය හමුවේ වුවද ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වර්ෂය පුරා සාධනීය ප්‍රගතියක් අත්කරගෙන ඇති බව හද පිරි අභිමානයෙන් සඳහන් කරනු කැමැත්තෙමි.

නිවාස සංවර්ධනය

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය පහසුකම් සපයන්නෙකු වශයෙන් කටයුතු කරමින් සමාලෝචිත වර්ෂය තුල නිවසක් අවැසි කුටුම්භ 12,319 ක් සඳහා ප්‍රතිලාභ සලසා දීමට දායක විය. එහිදී තිරසර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීමේ රජයේ අරමුණ ඇතිව දරිද්‍රතාවයෙන් පෙළෙන නිවසක් නොමැති ප්‍රජාව උදෙසා පූර්ණ රාජ්‍ය දායකත්වය ඇතිව ක්‍රියාත්මක ආධාර වැඩසටහන තුලින් නව නිවාස 9972 ක් ඉදිකිරීමට හැකිවීම සුවිශේෂී කරුණකි. වර්ෂය තුල නිවාස සංවර්ධන වෙනුවෙන් ආයතනය සෘජුවම ආයෝජනය කල මුදල රුපියල් මිලියන 5750.0 කි. සමස්ථයක් ලෙස නිවාසකරණය තුලින් ආර්ථිකයට රු.මි 14,783.0 ක පමණ දායකත්වයක් ලබාදීමට හැකිවිය. නිවාස සංවර්ධන ක්‍රියාවලිය හා සමගාමීව ප්‍රතිලාභී පවුල් වල දේපළ අයිතිය තහවුරු කිරීම සඳහා ක්‍රියාත්මක වැඩසටහන තුලින් සින්නක්කර ඔප්පු 1007 ක් පිරිනැමීය.

මූල්‍ය තත්වය

වර්ෂය තුල ප්‍රාග්ධන සංචිතය රුපියල් මිලියන 183 කින් ඉහල ගොස් ඇති අතර එසේ වුවද ජංගම නොවන වත්කම් ප්‍රමාණය රුපියල් බිලියන 3.99 කින් පහල බැසීමක් දැකිය හැක. දීර්ඝ කාලීන ණය ප්‍රමාණය රු.මි.853 කින් පහල ගොස් ඇති අතර , ජංගම බැරකම් රු.මි. 150 කින් අඩුවී ඇත. මේ අනුව වර්ෂය තුල මූල්‍ය ස්ථාවරත්වයක් අත්කර ගැනීමට ජාතික නිවාස සංවර්ධන අධිකාරියට හැකිවී ඇත. 2019 වර්ෂයට සාපේක්ෂව ආයතන හා පරිපාලන වියදම් රුපියල් මිලියන 1595.609 කින් අවම කිරීම තුලින් ආයතනයේ ශුද්ධ අලාභය රු.මි. 1998.826 කින් අඩුකර ගැනීමට හැකිවී ඇත.

මෙහෙයුම් ප්‍රතිඵල

1648 කින් යුත් ප්‍රශස්ථ කාර්යය මණ්ඩලයක් සමගින් රටේ පැවති වසංගත තත්වය හමුවේ වුවද රුපියල් බිලියන 2.082 ක ප්‍රමාණයකින් ණය ආපසු අයකර ගැනීමට හැකිවීම සුවිශේෂී තත්වයකි.

පුරා 41 වසරක ජාතික නිවාස සංවර්ධන අධිකාරි ඉතිහාසයේ අභියෝග රැසකට මුහුණදුන් 2020 වර්ෂය අනපේක්ෂිතව ඇතිවූ ගෝලීය වසංගත තත්වය හමුවේ වුවද වර්ෂය පුරා සාධනීය ප්‍රගතියක් අත්කර ගැනීම සඳහා අභියෝග භාරගනිමින් කැපවීමෙන් ක්‍රියාකල සමස්ථ සේවක ප්‍රජාවට හද පිරි ප්‍රණාමය පිරිනැමීමට මෙය අවස්ථාවක් කර ගනිමි.

ලලිත් එදිරිසිංහ
වැ.බ. සාමාන්‍යාධිකාරි

1 පොදු හැඳින්වීම

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය 1979 අංක 17 දරණ ජාතික නිවාස සංවර්ධන අධිකාරි පනත මගින් ශ්‍රී ලංකාවේ නිවාස සංවර්ධන කටයුතු කරගෙනයාම සඳහා ස්ථාපිත කර ඇති මෙම අධිකාරිය එහි කොළඹ පිහිටි ප්‍රධාන කාර්යාලයට අමතරව දිස්ත්‍රික් කාර්යාල 25 ක් සහ උප කාර්යාල 09 ක් මගින් දිවයින පුරා කටයුතු කරගෙන යනු ලබයි.

අපගේ දැක්ම

ශ්‍රී ලංකාවේ සෑම පවුලකටම මූලික පහසුකම් සහිත සුවපහසු නිවසක් හිමිකර දීම.

අපගේ මෙහෙවර

ශ්‍රී ලාංකීය ජනතාවගේ විශේෂයෙන්ම නිවසක් සතුකර ගැනීමට මාර්ගයක් නොමැති අඩු ආදායම්ලාභී පවුල්වල නිවාස අවශ්‍යතා ඉටුකර ගැනීම සඳහා ජාතික වශයෙන් උනන්දු කරවීම, පහසුකම් සැලසීම සහ සම්බන්ධීකරණය කිරීම මෙන්ම නිවසක් නොමැති මධ්‍යම පාන්තික පවුල් සඳහා සහන මිලට නිවසක් ඉදිකර ලබාදීම සඳහා අවශ්‍ය මැදිහත්වීම. එමගින් ඔවුන්ගේ සමාජ පැවැත්ම යහපත් කරලීම හා ආර්ථික සමෘද්ධිය ළඟාකරදීම සඳහා ජාතික නිවාස සංවර්ධන අධිකාරිය කටයුතු කරයි.

අපගේ අරමුණු

1979 අංක 17 දරණ ජාතික නිවාස සංවර්ධන අධිකාරි පනත අනුව අපගේ අරමුණු වන්නේ ..

- මහල් නිවාස හා වෙනත් වාසස්ථාන හෝ ගොඩනැගිලි ඉදිකිරිමෙහිලා කෙළින්ම නියුක්තවීම.
- නිවාස හිගය අඩු කිරිම පිණිස නිවාස සංවර්ධන යෝජනා ක්‍රම පිහිටුවීමට සැලසුම් සකස් කිරීම.
- මුඩුක්කු හා පැල්පත් සහිත ප්‍රදේශවලින් එම මුඩුක්කු සහ පැල්පත් ඉවත්කිරිම සහ ඒ ප්‍රදේශ ප්‍රතිසංවර්ධනය කිරිම.
- නිවාස සංවර්ධනයට රුකුල්දීම.
- අධිකාරියේ අරමුණු අතුරෙන් කිසිවක් ක්‍රියාවේ යෙදවීම සඳහා ඉඩම් සංවර්ධනය කිරීම හෝ ප්‍රතිසංවර්ධනය කිරීම.
- නිවාස සංවර්ධනය සඳහා යම් තැනත්තකුට ඉඩම් ලබාදීම.
- අධිකාරියේ අරමුණු අතුරෙන් කිසිවකට සමානවන යම් ක්‍රියාකාරකමක නියුක්ත තැනත්තන්ට මුදල් හෝ වෙනත් පහසුකම් සැපයීම.
- නිවාස සංවර්ධනයෙහි සියළු අංශවලට අදාළවන ක්‍රියාකාරකම්වල නිරතවීම, ඒවාට අනුබලදීම සහ ඒ ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරිම.
- ඉහත දැක්වෙන අරමුණු සියල්ල හෝ ඉන් කිසිවක් ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය විය හැකි හෝ හිතකර විය හැකි වෙනත් සියළුම ක්‍රියාකාරකම්වල යෙදීම.

අපගේ පරමාර්ථ

- අඩු ආදායම්ලාභී පවුල් වලට නිවාස ඉදිකර ගැනීම සඳහා පහසුකම් සැලසීම.
- අන්ත දුගී පවුල් වලට නිවාස ඉදිකරගැනීම සඳහා සහාය ලබාදීම.
- මුඩුක්කු සහ පැල්පත්වාසීන්ට නිවාස පහසුකම් සැලසීම සඳහා ඍජුව සම්බන්ධවීම හා සම්බන්ධීකරණය කිරිම.
- මධ්‍යම ආදායම් ඇති පවුල් සඳහා දූරිය හැකි මිලකට නිවාස ඉදිකිරිම පිණිස අදාළ ඉදිකිරිමේ කටයුතු සිදුකරන්නන්හට පහසුකම් සැපයීම.
- නිවාස ඉදිකිරිමේ අරමුණු සඳහා ඉඩම් කැබලි ඍජුව ලබාදීම හෝ පහසුකම් සැලසීම.
- නිවසක ජීවත්වීමේ අයිතිය තහවුරු කිරිම.
- පැරණි නිවාස සංකීර්ණයන්වල ජීවත් වන පවුල් සඳහා එම නිවාස සංකීර්ණ ප්‍රතිසංස්කරණය කිරිම මගින් සුදුසු ප්‍රසන්න පරිසරයක් සහිත නිවාස ක්‍රම බවට පත් කිරිම.
- නාගරික අඩු ආදායම්ලාභී පවුල්වලට නිවාස සපයාදීම.
- කාර්යක්ෂම ගුණාත්මක සහ ස්ථිරසාර සේවාවක් සැපයීම.

සංස්ථාපිත තොරතුරු

නම	:	ජාතික නිවාස සංවර්ධන අධිකාරිය
නීතිමය භාවය	:	1979 අංක 17 දරණ පනත
සංස්ථාපිත වර්ෂය	:	1979
ලියාපදිංචි කාර්යාලය	:	ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මහලේකම් කාර්යාලය, අංක 34 , සර් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ 02.
දුරකථන අංකය	:	2421606 , 2431707 , 2430410 , 2431722 2421748 , 2380874
ෆැක්ස්	:	2434892
විද්‍යුත්තැපෑල	:	chairman@nhda.lk
වෙබ් අඩවිය	:	www.nhda.lk
විගණකවරු	:	විගණකාධිපති විගණකාධිපති දෙපාර්තමේන්තුව
උපදේශන නීතිඥවරු	:	නීතිපති නීතිපති දෙපාර්තමේන්තුව හල්ස්ඩෝෆ් , කොළඹ 12.
බැංකුකරුවෝ	:	ලංකා බැංකුව , ආයතනික ශාඛාව , ඇව්ලන් චතුරශ්‍රය , කොළඹ 01.
	:	මහජන බැංකුව , මූලස්ථාන ශාඛාව, සර් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ 02.

අධ්‍යක්ෂ මණ්ඩලය

සභාපති

රේණුක දුෂ්‍යන්ත පෙරේරා මහතා
අංක 365,
නාගහවත්ත පාර,
කොටිකාවත්ත ,
මුල්ලේරියාව.

උප සභාපති

නීතිඥ ඩී. එම්. අරුණ කීර්ති දසනායක මහතා
අංක 79/14 ,
කොළඹ පාර ,
කුරුණෑගල.

අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

සුදත් අබේවර්ධන මහතා
අංක බී-5/1/4 ,
හිඹුටු උයන නිවාස සංකීර්ණය,
මුල්ලේරියාව නව නගරය , මුල්ලේරියාව.

ඉංජිනේරු විමලසිරි වන්නිආරච්චි මහතා
ශ්‍රියාණි ,
ගල්පොත්තයාය,
ජුලම්පිටිය , වීරකැටිය.

නීතිඥ උදයන සී කිරිදිගොඩ මහතා
අංක 452,
නීතිඥ කාර්යාලය,
විලියම් ගොපල්ලව මාවත,
මහනුවර.

ඩී. එම්. එස්. ද සිල්වා මහත්මිය
සහකාර අධ්‍යක්ෂක,
විදේශ සම්පත් දෙපාර්තමේන්තුව,
(මුදල්) කාමර අංක 310, 3 වන මහල,
කොළඹ 01.

සංස්ථාපිත කළමනාකරණය

පී. එම්. එල්. පී. එදිරිසිංහ මහතා
වැ.බ. සාමාන්‍යාධිකාරී

පී. ටී. එස්. ප්‍රියදර්ශනී මහත්මිය
වැ. බ. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්)

පී. එම්. එල්. පී. එදිරිසිංහ මහතා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
(මානව සම්පත් කළමනාකරණ හා පාලන)

එච්. එච්. ලීලානන්ද මහතා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
(දේපල කළමනාකරණ හා අලෙවි)

ආර්. පී. කේ. පල්ලේවෙල මහතා
වැ. බ. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
(සැලසුම් හා ප්‍රගති)

පී. ඒ. එස්. පී. ආරියවංශ මහතා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
(නිවාස සංවර්ධන)

කේ. එච්. සී. ජයලත් මහත්මිය
වැ. බ. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (නීති)

එම්. එන්. එස්. මහානාම මහතා
ප්‍රධාන අභ්‍යන්තර විගණක

නීතිඥ මනෝරි ටී. ඔලබොඩුව
අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ පරිපාලන දිස්ත්‍රික් මට්ටමින් විමධ්‍යගත වී ඇති ආකාරය



දිස්ත්‍රික් කාර්යාල ලිපිනයන් හා දුරකථන අංක

දිස්ත්‍රික් කාර්යාලය	ලිපිනය	දුරකථන අංකය	ෆැක්ස්	ඊ මේල්
අම්පාර	පොලිස් නිවාස පාර , අම්පාර.	063-2222045	063-2222045	dmampara@nhda.lk
අනුරාධපුර	අංක 390 , බණ්ඩාරනායක මාවත, නව නගරය, අනුරාධපුර.	025-2222649	025-2222649	dmanuradhapura@nhda.lk
බදුල්ල	ක්ලිනික් පාර, බදුල්ල.	055-2222113	055-2222113	dmbadulla@nhda.lk
මඩකලපුව	සරවනා පාර , කල්ලඩි , මඩකලපුව.	065-2224473	065-2224473	dmbatticaloa@nhda.lk
කොළඹ	246 බී , හයිලෙවල් පාර , කොට්ටාව.	011-2178224	011-2178224	dmcolombo@nhda.lk
කොළඹ නගර-උ	පරිසර මාවත , මාළිගාවත්ත , කොළඹ 10.	011-445546	011-2435146	dmccity@nhda.lk
කොළඹ නගර-ද	280/11, මැනිංටවුන් නිවාස ක්‍රමය, ඇල්විටිගල මාවත, කොළඹ 08.	011-679857	011-2669753	dmmtown@nhda.lk
ගාල්ල	ඊ-කෝට් බිල්ඩින්, පෙල්ඩර් විදිය, කොටුව , ගාල්ල.	091-2234232	091-2234232	dmgalle@nhda.lk
ගම්පහ	වලව් වත්ත, ගම්පහ.	033-2226017	033-2234265	dmgampaha@nhda.lk
හම්බන්තොට	ජා.නි.සං.අධි. , දිස්ත්‍රික් කාර්යාලය , නගරසභා පුස්ථකාල ගොඩනැගිල්ල, 1 වන මහල, හම්බන්තොට.	047-2256023	047-2256022	dmhambantata@nhda.lk
යාපනය	වන සංරක්ෂණ කාර්යාල පටුමග, ඡුන්ඩික්කුලි , යාපනය.	021-2222039	021-2226941	dmjaffna@nhda.lk
කළුතර	3 වන මහල, කච්චේරි සංකීර්ණය , කළුතර.	034-2221299	034-2222298	dmkalutara@nhda.lk
මහනුවර	කච්චේරි සංකීර්ණය , යටිනුවර විදිය, මහනුවර.	081-2223139	081-2223139	dmkandy@nhda.lk
කෑගල්ල	අඹන්පිටිය, ගලිගමුව නගරය (කෑගල්ල)	035-2229737	035-2229738	dmkegalle@nhda.lk
කිළිනොච්චිය	155 වැනි සැතපුම් කණුව (ඒ-9 නුවර පාර) කිලිනොච්චිය	021-2285757	021-2285757	dmkilinochchi@nhda.lk
කුරුණෑගල	05, මිහිඳු මාවත , කුරුණෑගල.	037-2222014	037-2222014	dmkurunegala@nhda.lk
මන්නාරම	පල්ලිමුණේ පාර, මන්නාරම.	023-2222315	023-2222141	dmmannar@nhda.lk
මාතලේ	833/ඒ , අළුවිහාරේ , මාතලේ.	066-2222134	066-2222134	dmmatale@nhda.lk
මාතර	දුම්රියපල පාර, මාතර.	041-2222986	041-2222986	dmmatara@nhda.lk
මොණරාගල	වැල්ලවාය පාර, මොණරාගල .	055-2276202	055-2276202	dmmonaragala@nhda.lk
මුලතිව්	ඒ-9 නුවර පාර, මාන්කුලම් (මුලතිව්)	021-2060033	021-2060022	dmmullaitivu@nhda.lk
නුවරඑළිය	උඩුපුස්සැල්ලාව පාර, හාවාඑළිය (නුවරඑළිය)	052-2222925	052-2222925	dmneliya@nhda.lk
පොලොන්නරුව	පුලතිසිපුර , හිගුරක්ගොඩ (පොලොන්නරුව)	027-2246362	027-2246362	dmpolonnaruwa@nhda.lk
පුත්තලම	තම්මැන්නාගම , ආණමඩුව (පුත්තලම)	032-2263425	032-2263425	dmputtalam@nhda.lk
රත්නපුර	නව නගරය , රත්නපුර.	045-2228996	045-2228996	dmrathnapura@nhda.lk
ත්‍රිකුණාමලය	බලාගාරය පාර , ත්‍රිකුණාමලය.	026-2222503	026-2222503	dmtrinco@nhda.lk
වවුනියාව	උද්‍යාන පාර , වවුනියාව.	024-2222214	024-2222050	dmvavuniya@nhda.lk

අපගේ ප්‍රධාන ක්‍රියාකාරකම්

විවිධ උපායමාර්ග හා ක්‍රියාකාරකම් තුලින් ආයතනයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ප්‍රධාන වැඩසටහන් හා ව්‍යාපෘති කිහිපයක් ක්‍රියාවට නංවන ලදි.

1. අඩු ආදායම්ලාභී පවුල් සඳහා නිවාස ණය පහසුකම් ලබාදීම තුලින් නිවාස ඉදිකර ගැනීමට සහායවීම

- සහනදායී වාර්ෂික පොලියක් යටතේ ජීවත්වන නිවස වැඩිදියුණු කර ගැනීමට හෝ නව නිවසක් ඉදිකර ගැනීමට ණය පහසුකම් ලබාදීම.
- වැඩිදියුණු කලයුතු නිවාස සංවර්ධනය කිරීම සඳහා බැංකු හා ඒකාබද්ධව ණය වැඩසටහන ක්‍රියාත්මක කිරීම

2. ණය + ආධාර ලබාදීම තුලින් අර්ධ වශයෙන් නිමි නිවාස නිමහම් තත්වයට පත්කිරීම

- අඩු ආදායම්ලාභී පවුල් සඳහා ණය + ආධාර නිවාස සංවර්ධන වැඩ සටහන ක්‍රියාත්මක කිරීම තුලින් අර්ධ වශයෙන් නිමි නිවාස නිමහම් තත්වයට පත්කිරීම.

3. මූල්‍යාධාර ලබාදීම තුලින් නිවාස ඉදිකර ගැනීමට සහායවීම

- නිවසක් හෝ ඉඩමක් නොමැති , ණය මුදල් ලබාගෙන ආපසු ගෙවීමේ හැකියාවක් නොමැති අඩු ආදායම්ලාභී පවුල් දිළිඳු පවුල් සඳහා ආදර්ශ ගම්මාන තුලින් නව නිවාස ඉදිකිරීම.
- උතුරු නැගෙනහිර පළාත් වල පැවති යුද්ධය හේතුවෙන් අවතැන්වූ පවුල් නැවත පදිංචි කිරීම සඳහා ආධාර ලබාදීම තුලින් නව නිවාස ව්‍යාපෘති ඉදිකිරීම.
- දිළිඳු , ආබාධිත හා අසරණ පවුල් මෙන්ම රටට වැඩදායී සේවාවක් ඉටුකල විශේෂ සාමාජිකයන් සිටින පවුල් වෙනුවෙන් සෙවණ ආධාර ලබාදීම තුලින් නව නිවාස ඉදිකිරීම.

4. වකුගඩු රෝගී සාමාජිකයන් සිටින පවුල් වල නිවාස අවශ්‍යතා ඉටුකිරීම

5. ඉන්දියානු ආධාර වැඩසටහන

- ඉඩමක් හෝ නිවසක් නොමැති අඩු ආදායම්ලාභී පවුල් සඳහා ඉන්දියානු රජයේ මූල්‍යාධාර තුලින් උතුර හා දකුණ පළාත්වල නව නිවාස ව්‍යාපෘති ඉදිකිරීම.

6. පාස්කු ප්‍රහාරයෙන් විපතට පත් පවුල් වල නිවාස අවශ්‍යතාවයන් සපුරාලීම

7. විරු සුමිතුරු නිවාස වැඩසටහන

- රට දැය වෙනුවෙන් දිවිපිදූ හා පූර්ණ ආබාධිත තත්වයට පත්වූ රණවිරු සාමාජිකයින් වෙනුවෙන් ආධාර ලබාදීම තුලින් නිවාස අවශ්‍යතා සපුරාලීම.

8. මධ්‍ය ආදායම්ලාභී පවුල් සඳහා නව නිවාස

- ස්ථීර මාසික ආදායම් ලබන රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සේවකයින් හා මැදි අදායම්ලාභී හා ඉහල ආදායම්ලාභී ව්‍යාපාරිකයින් සඳහා රාජ්‍ය හා පෞද්ගලික දායකත්වය තුලින් නව නිවාස ලබාදීමට සියලු පහසුකම් සහිත මහල් නිවාස ඉදිකිරීම.

9. රාජ්‍ය අංශයේ හා පෞද්ගලික අංශය හවුල්ව නිවාස ඉදිකිරීම වර්ධනය කිරීම.

- යෝග්‍ය භූමි හඳුනාගැනීම.
- කැමති පාර්ශවයන් කැඳවා සුදුසු සංවර්ධකයින් සමග සාකච්ජා කිරීම සහ යෝජනා ලබා ගැනීම.
- යෝජනා ඇගයීම සහ සංවර්ධකයින් තෝරා ගැනීම.
- ව්‍යාපෘති සැලසුම් නිර්මාණය කිරීම හා ඒකාබද්ධ අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීම, ක්‍රියාත්මක කිරීම පාලනය කිරීම සහ තත්වය සහතික කිරීම.
- අළෙවිකරණය සහ නිවාස විකුණුම්.
- කළමනාකරණ සංස්ථා පිහිටුවා ගැනීමෙන් ප්‍රතිලාභීන් දිරිගැන්වීම් සිදු කිරීම.

10.ජනාවාස ආශ්‍රිත මූලික යටිතල පහසුකම් සංවර්ධනය කිරීම

11. පැරණි නිවාස ක්‍රම නවීකරණය

- පැරණි මහල් නිවාස ක්‍රමවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.
- මහල් නිවාස අළුත් වැඩියා කිරීම.

12. නිවාස ඉදිකිරීම් හා සහාය සේවා සැපයීම

- නිවාස යෝග්‍යතා අධ්‍යනය කිරීම.
- ප්‍රජාව දැනුවත් කිරීම සහ සංවිධානය කිරීම.
- ග්‍රාමීය නිවාස කමිටු පිහිටුවීම.
- නිවාස ඉදිකිරීම් සඳහා අවශ්‍ය තාක්ෂණ සහාය ලබාදීම.
- අඩු පිරිවැය ඉදිකිරීම් තාක්ෂණ ක්‍රමවේදයන් ගැන තොරතුරු ව්‍යාප්ත කිරීම.
- අවශ්‍යතාවය මත මුල්‍යමය සහාය සැපයීම.
- ඉදිකිරීම් වල තත්වය / අනුකූලතාවය සහතික කිරීම සඳහා අධීක්ෂණය කිරීම.
- යටිතල පහසුකම් ඇති කිරීම / සම්බන්ධතාවය පැවැත්වීම.

13. නාගරික සංවර්ධන වැඩ සටහන ක්‍රියාත්මක කිරීම (නිවාස ව්‍යාපෘති)

- යෝග්‍ය ස්ථාන හඳුනා ගැනීම.
- මැනුම් කටයුතු සිදුකිරීම.
- මුල්‍යමය හැකියා මට්ටම් තීරණය කිරීම.
- සැලසුම් පිළියෙල කිරීම සහ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම.
- කළමනාකරණ සංස්ථා ස්ථාපිත කිරීම.
- අයිතිය පැවරීම.

14. ඉඩම් කට්ටි ලබාදීම.

- යෝග්‍ය භූමි හඳුනා ගැනීම.
- යෝග්‍යතා අධ්‍යනය කිරීම.
- කැබැලි සැලසුම් පිළියෙල කිරීම.
- අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම.
- ඉඩම්ලාභීන් හඳුනා ගැනීම සහ තෝරා ගැනීම.
- අවශ්‍යනම් ණය දෙන ආයතන සමග සම්බන්ධතාවය ඇති කරගැනීම.
- තෝරාගත් ඉඩම් ලාභීන්ට ඉඩම් කට්ටි පැවරීම.
- නිශ්චිත කාල පරාසයක් තුල එම ඉඩම් වල ප්‍රතිලාභීන්ට නිවාස ඉදිකර ගැනීමට මග පෙන්වීම.

15. ණය අයකිරීම් වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම

- වාර්ෂික ඉලක්ක ලබා දීම, ඉලක්ක සපුරා ගැනීමට අවශ්‍ය මග පෙන්වීම, ඊට අදාල ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම.
- ණය හා කුලී ආදායම් ප්‍රවර්ධන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.
- මාසික ප්‍රගති සමාලෝචනය කිරීමට හා ඒවායේ දුර්වලතා හඳුනාගෙන පිලියම් යෙදීම.
- ණයකරුවන්ට තම ණය වාරික ආපසු ගෙවීමේ වගකීම හා ණය ගෙවීමේ වැදගත්කම තුලින් නැවත නිවාස සංවර්ධනයට එම මුදල් යෙදවීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.
- අයකිරීම් නියෝජිතයින් හා අයකිරීම් නිලධාරින් සඳහා පුහුණු වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.
- ආදායම් ප්‍රවර්ධන වැඩසටහන තුල දක්වන දායකත්වය ඇගයීම සඳහා වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.

16. නිවාස සම්බන්ධ උපදේශන සේවා

- දිස්ත්‍රික් නිවාස උපදේශන මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම.
- යෝග්‍යතා වාර්තා සකස් කිරීම.
- අවශ්‍ය අවස්ථාවේදි නිවාස සැලසුම් සැපයීම.
- ප්‍රමාණ / ද්‍රව්‍ය ලයිස්තු / පිරිවැය ඇස්තමේන්තු පිළියෙල කිරීම.
- සැලසුම් සඳහා අනුමැතියන් ලබා ගැනීම.
- ඉදිකිරීම් අධීක්ෂණය සහ තත්ව සහතික වීම.
- ඉදිකිරීම් දත්ත බැංකුවක් පවත්වාගෙන යාම.
- අඩු වියදම් තාක්ෂණික ක්‍රම පිළිබඳව දත්ත පවත්වාගෙන යාම.

17. නිවාස ක්‍රමවල පොදු ප්‍රදේශ, එහි යටිතල පහසුකම් සහ සේවාවන් සහිතව පළාත් අධිකාරියට පැවරීම.

- පොදු ප්‍රදේශ / විවෘත ස්ථාන වල මායිම් සලකුණු කිරීම.
- මිනින්දෝරු සැලසුම් පිලියෙල කිරීම.
- පළාත් අධිකාරියෙන් එකඟතාවය ලබා ගැනීම.
- ඔප්පුවක් මගින් දේපල පැවරීම.
- නිවාස හිමියන්ට දැනුම් දීම.

18. කුසලතා වර්ධනය සඳහා පුහුණුව

- වෘත්තිය ආයතන සහ නියෝජ්‍ය ආයතන සමග සාකච්ඡා කර පුහුණු සැසි සංවිධානය කිරීම.
- වෘත්තිය පුහුණු අවස්ථා සැකසීම.
- මූලික උපකරණ සහාය සැපයීම.
- ක්‍රියාකාරිත්වය පරීක්ෂා කිරීම.
- වාසිදායි රැකියා සඳහා උපකාරවීමට දත්ත බැංකුවක් තුල පවත්වාගෙන යාම.
- කුසලතා ඇති පුද්ගලයන්ගේ තොරතුරු නාමාවලියක් පවත්වාගෙන යාම.

19. නිවාස තොග හා නිවාස අවශ්‍යතාව පිළිබඳව දත්ත පවත්වාගෙන යාම.

- ග්‍රාම නිලධාරීන් සහ ප්‍රාදේශීය ලේකම්වරුන් සමග සම්බන්ධීකරණය සහ දත්ත රැස් කිරීම.
- ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ උපදේශන මධ්‍යස්ථාන සමග සම්බන්ධීකරණය සහ දත්ත ඒකරාශී කිරීම.
- පළාත් අධිකාරි සමග සම්බන්ධීකරණය සහ දත්ත රැස්කිරීම.
- දිස්ත්‍රික් නිවාස කමිටුව වෙත දත්ත ඉදිරිපත් කිරීම.
- කමිටුව භාර ගත් දත්ත පෙල ගැස්වීම.
- දත්ත, අර්ධ වාර්ෂිකව දත්ත බැංකුව වෙත ඉදිරිපත් කිරීම.
- අනාගත සැලසුම් සඳහා දත්ත භාවිතයට ගැනීම.

2. සංස්ථාපිත පාලනය

ආයතනික පාලනයේ උසස් මට්ටම් දක්වා ගමන් කිරීම සඳහා දැඩි නොනවතින කැපවීමක් අප සතුව ඇත. ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරී ආයතනයේ ප්‍රමීතීන් මෙන්ම රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය ආදී ආයතන අමාත්‍යාංශ මගින් යෝජනා කරන ලද සුදුසුම කටයුතු අනුගමනය කිරීමට සැමවිටම උත්සාහ කරන අතර, ගරු අමාත්‍ය මණ්ඩලය මගින් අනුමත කරන තීරණ අධ්‍යක්ෂ මණ්ඩල තීරණ හා වර්තමානයේදී රාජ්‍ය අමාත්‍යාංශය මගින් ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණ හා නිර්ණායකයන්ට අනුකූලව ක්‍රියාත්මක කිරීම.

අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීම්

අධ්‍යක්ෂ මණ්ඩලය සෑම මාසයකම රැස්වෙන අතර අවශ්‍යතාවය අනුව මසකට රැස්වීම් කිහිපයක් වුවද පැවැත්වීමට සිදුවේ. අයවැයට සාපේක්ෂකව ප්‍රගතිය සෑම මසකම එමගින් සමාලෝචනය කරයි. විචලනයන් හඳුනාගෙන ප්‍රතිපත්ති වෙනස් කිරීම සඳහා සුදුසු ප්‍රතිකර්ම යොදයි. 2020 වසර තුල රැස්වීම් වාර 22 ක් පවත්වන ලදි.

විගණන හා කළමනාකරණ කමිටු

සාමාන්‍යාධිකාරිවරයා සහ අධ්‍යක්ෂවරු 03 දෙනකුගෙන් සමන්විත විගණන සහ කළමනාකරණ කමිටු රැස්වීමට අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක හා රජයේ විගණක අධිකාරි සමගින් ආයතනයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක ඇතුළු සියලුම නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරුන් සහභාගී වේ.

විගණන හා කළමනාකරණ කමිටු මගින් ගිණුම් හා මූල්‍ය කළමනාකරණ ක්‍රමයේ මතා පැවැත්ම සහතික කෙරෙන අතර ගිණුම් ප්‍රමිතීන්ට අදාල නීති රීති අනුව අභ්‍යන්තර පාලනයේ ක්‍රියාකාරිත්වය සමාලෝචනය කෙරේ. 2020 වසර තුල විගණන සහ කළමනාකරණ කමිටු රැස්වීම් වාර 06 ක් පවත්වා ඇත.

2020 වර්ෂයේ පහත නම් සඳහන් අධ්‍යක්ෂවරුන් හා බාහිර නිළධාරීන් එනම් මුදල් අමාත්‍යාංශය නියෝජනය කරන අධ්‍යක්ෂ මණ්ඩළ සාමාජික, රජයේ විගණක, ග්‍රාමීය නිවාස සහ ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක, ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ උප සභාපතිතුමා හා සෙසු අධ්‍යක්ෂ මණ්ඩළ සාමාජිකයින් හා ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ ප්‍රධාන අභ්‍යන්තර විගණක ඇතුළු නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරුන් කළමනාකරණ කමිටු සාමාජිකයින් ලෙස සහභාගී වී ඇත.

මාසික ප්‍රගති සමාලෝචන රැස්වීම

ගරු රාජ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්, සභාපති, උප සභාපති , අධ්‍යක්ෂ මණ්ඩළය, සාමාන්‍යාධිකාරි හා සියලුම නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරුන් දිස්ත්‍රික් කළමනාකරුවන්, අමාත්‍යාංශයට සම්බන්ධිත ආයතනවල ඉහළ කළමනාකාරීත්වයේ නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් සතිපතා හා මාසිකව ආයතනයේ කටයුතු පිළිබඳව ප්‍රගතිය සමාලෝචනය කරනු ලැබීය.

අභ්‍යන්තර පාලනය

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය තම ආයතනයේ වත්කම් වල සුරක්ෂිතභාවය සහ උපරිම භාවිතය සහතික කිරීම සඳහා අභ්‍යන්තර පාලන ප්‍රතිපත්ති සහ උපදේශනයන් ක්‍රියාත්මක කර ඇත. නියෝජ්‍ය සමාන්‍යාධිකාරි කොට්ඨාශ අනුව එම කොට්ඨාශයන්හි අංශ අනුව ධුරාවලියවකට වගකීම් ඉහළ සිට පහලට බෙදා හැර ඇත. එසේම එක් අයෙකුගේ රාජකාරිය තවත් අයෙකුගේ රාජකාරිය තුලින් ස්වයංක්‍රීයව පරීක්ෂාවකට භාජනය වන පරිදි රාජකාරි බෙදා හැර තිබේ.

ඒ හා සමානව අධ්‍යක්ෂ මණ්ඩළය මනාව සැකසුනු මාසික වාර්තා කරන ක්‍රමයක් තුලින් අභ්‍යන්තර පාලනය සහතික කරන අතර, වත්කම් හා බැරකම් අතර සමබරතාවය පවත්වා ගැනීම සඳහා අවශ්‍ය තීරණ ගනු ලැබේ.

සතිපතා සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් කළමනාකරණ කමිටු රැස්වීමක් පවත්වන අතර, මෙහිදී සියළු නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි කොට්ඨාශවල කටයුතු පිළිබඳ සාකච්ඡා කරනු ලබයි. මිල කමිටු, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු , දේපල අනු කමිටු හා අභියාචනා කමිටු, විනය කමිටු පත් කිරීම සඳහා ද පියවර ගෙන ඇත. අවශ්‍යතාවය පරිදි එම කමිටුවලද රැස්වීම් පවත්වා තීරණ ගනු ලැබේ.

විධායක කළමනාකරණය

ප්‍රධාන කාර්යාලයේ සෑම අංශයකම ප්‍රධානත්වය නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරයෙකු - කු හෝ සහකාර සාමාන්‍යාධිකාරිවරයෙකු දරණ අතර, දිස්ත්‍රික් කාර්යාල 25 ක් සමග කලාප හා උප කාර්යාල 09 ක වගකීම ජ්‍යෙෂ්ඨ දිස්ත්‍රික් කළමනාකරු / දිස්ත්‍රික් කළමනාකරු හා කළමනාකරු සතු වේ.

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරින් සහ ජ්‍යෙෂ්ඨ දිස්ත්‍රික් කළමනාකරු / දිස්ත්‍රික් කළමනාකරුවන් සාමාන්‍යාධිකාරි වෙත රාජකාරි වාර්තා කල යුතු අතර, ප්‍රධාන විධායක නිලධාරි වන සාමාන්‍යාධිකාරි විසින් සභාපති ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩළයට අදාළ රාජකාරි වාර්තා කිරීම හා අදාළ සම්බන්ධීකරණ කටයුතු සිදු කල යුතුය.

අවධානම් කළමනාකරණය

විශාල සේවාදායකයන් සමූහයකට සියලුම පහසුකම් සහිත නිවාස පහසුකම් සපයන සහ දිවයින පුරා ව්‍යාප්ත වූ ප්‍රාදේශීය කාර්යාල 25 කින් සමන්විත ශ්‍රී ලංකාවේ එකම රාජ්‍ය ආයතනය වන ජාතික නිවාස සංවර්ධන අධිකාරිය එහි විවිධ හවුල්කරුවන්ගේ අවශ්‍යතා රැක ගැනීම සඳහා මූල්‍යමය සහ මූල්‍යමය නොවන අවධානම් රාශියකට මුහුණ දීමට සිදුවන අතර, එය පූර්ව කළමනාකරණය කරනු ලැබේ.

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය තම අරමුණු ළඟාකර ගැනිමට, එහි සංස්ථාපිත කළමනාකාරිත්වයේ උපදෙස් මත ප්‍රතිපත්තීන් , ක්‍රියාමාර්ග සහ අවධානම් කළමනාකරණය තහවුරු කිරීම සඳහා අවශ්‍ය ව්‍යුහයන් ගොඩනැගීම අධ්‍යක්ෂ මණ්ඩලය මගින් සිදු කරයි. එමගින් ජාතික නිවාස සංවර්ධන අධිකාරියෙහි සියළුම ව්‍යාපාරික මෙන්ම ජනතාවට සේවා සපයන ආයතනයක් ලෙස අරමුණු ලගාකර ගැනීම සිදු කරනු ලැබේ.

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය ආපදාවට ලක්වීම කෙරෙහි බලපාන ක්‍රියාදාමයන් හා පාලනය කළහැකි පද්ධතීන් වල දුර්වලතා හඳුනාගැනීම සඳහා අවදානම් කළමනාකරණ ක්‍රියාදාමය අධිකාරියේ විගණන අංශය සමග සම්බන්ධ වී කටයුතු කරයි. කාර්යක්ෂමතාවය සහ පාලනමය තත්වයේ ප්‍රමාණාත්මතාවය පිළිබඳව ස්වාධින අදහස් කාලානුරූපීව කළමනාකරණය වෙත පළකිරීම විගණන අංශය මගින් සිදුකරනු ලබයි.

ද්‍රවශීලී අවධානම

ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ ගිවිසුම් සඳහා වූ බැඳීම් නියමිත කාලය තුළ දී ඉටුකිරීමට නොහැකිවූවිට මෙම අවධානමට ගොදුරුවේ. ඒවායේ කාලය ඉකුත් අවස්ථාවලදි මූල්‍යමය වගකීම් ඉෂ්ඨ කිරීම සඳහා අරමුදල් තිබීම සහ අවශ්‍යතා පැන නැගුණ අවස්ථාවලදි ඒවායෙහි ප්‍රයෝජන ලබා ගැනීම සඳහා අවශ්‍ය මූල්‍යමය ප්‍රතිපාදන තිබෙන බව තහවුරු කිරීම මෙහි ඇතුලත් වේ.

සැලසුම්කරණය සඳහා මගපෙන්වීම, ක්‍රමවත් අවශ්‍යතාවයන්ට අනුව කටයුතු කිරීම, ගිවිසුම් බැඳීම් සහ වර්ධන අපේක්ෂාවන් සඳහා මුහුණ දීමට අවශ්‍ය ප්‍රමාණවත් ද්‍රවශීලි බවක් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සතු වන බව තහවුරු කිරීම ආදි ප්‍රධාන කරුණු අධ්‍යක්ෂක මණ්ඩලයට සහ සංස්ථාපිත කළමනාකරණයේ සාමාජිකයින් වෙත කළමනාකරණය සඳහා පවරා දී ඇත.

ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය එය සතු ප්‍රධාන අරමුණු ලගාකර ගැනීම සඳහා,

- රාජ්‍ය ප්‍රතිපත්ති හා ආයතනික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරිමේදි සමබරතාවයකින් ද්‍රවශීලතාවයට බාධාවක් නොවන අයුරින් ක්‍රියාත්මක කිරිම.
- මුදල් ඉපයීම සම්බන්ධ විකල්ප මාර්ග ප්‍රමාණවත් ලෙස තහවුරු කිරිම.
- පවත්නා ණය ආයෝජන සහ මුදල් ඉපයීමේ ක්‍රියාමාර්ග බාලානුරූපීව නැවත සලකා බැලීම.
- පවතින මිල ගණන් සමාලෝචනයට ලක්කරන අතරම, තරඟකරුවන්ගේ මිල ගණන් විශ්ලේෂනයක් සිදු කිරිම.
- සංස්ථාපිත නිර්ණායකයන්ට අනුකූලව ද්‍රවශීලි අනුපාත සඳහා මග පෙන්වීම.

ප්‍රධානයන් , අභ්‍යන්තර උපයන අරමුදල් හා මුදල් බවට පත්කළ හැකි කෙටිකාලීන ආයෝජන පාලනය කිරීම තුළින් ද්‍රවශීලිතාවය පවත්වාගෙන යාම දෛනිකව කරනු ලැබේ.

වෙළඳපොල අවධානම

මිල සංවේදි වත්කම් හා බැරකම් පවත්වාගෙන යෑමේ දී පැනනගින පාඩු හා සම්බන්ධව මෙම අවධානම ප්‍රධාන වශයෙන් පොලී අනුපාතයන්ගේ වෙනස්වීම සහ කාලයත් සමග ගොඩනැගිලි ද්‍රව්‍යවල මිල දෝලනය වීම, පුහුණු ශ්‍රමික ගාස්තු ඉහළ යාම හේතුවෙන් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වෙත මෙය බලපානු ලැබේ. විශේෂයෙන්ම රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරිමේදි මෙම තත්වය තදින් බලපානු ලබයි.

වෙළඳ පොලේ නිවාස සඳහා පවතින අධික ඉල්ලුම හේතුවෙන් නිවාසයන්හි මිල ඉහලයාමේ අවධානම පාලනය කිරීමට ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වැනි රාජ්‍ය ආයතන වල මැදිහත්වීම අවශ්‍යවේ.

රුපියල අවප්‍රමාණය වීමත් සමග ඉදිකිරීම් ද්‍රව්‍ය වල මිල ඉහල යාම විශේෂයෙන් වහල සෙවිලි ද්‍රව්‍ය , ටයිල් වර්ග හා නාන කාමර අයිතම වල සිදුව ඇති අධික මිල ඉහල යාමේ
අවධානම හා ශ්‍රමය සඳහා වන වියදම් වල ඉහල යාම වෙළඳ පොල මිල ගණන් වලට නිවසක් අවශ්‍ය සෑම පුද්ගලයෙකුටම නිවසක් සතු කිරිමට රජය මගින් ලබා දෙන මුදල ප්‍රමාණවත් නොවීම හේතුවෙන් වෙළඳ පොල අවධානමට මුහුණදීමට ජාතික නිවාස සංවර්ධන අධිකාරියට සිදුවේ.

සංස්ථාපිත කළමනාකරණ අරමුණු ලඟාකර ගැනීමට දායකව කටයුතු කරන අනෙකුත් ප්‍රධාන හවුල්කාර ආයතනයන්ගේ අවශ්‍යතාවයන් සහ සේවාදායකයන්ගේ මුදලට සරිලන සේවාවක් සඳහා වටිනාකමක් සපයා දෙමින් නිවාස වෙළඳ පොලට එල්ල වී ඇති තර්ජනයන් උපරිමයෙන් පාලනය කරගැනීම සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයන් විසින් සිදු කරනු ලැබේ.

මෙහෙයුම් අවධානම

භාහිර තරඟකාරී බලවේගයන්ට මුහුණදීමට අපහසු හෝ ක්‍රියාකාරකම්වලට බාධාවන් පමුණුවන අභ්‍යන්තර දුර්වලතා නිසා ප්‍රමාණවත් නොවන හෝ අභ්‍යන්තර ක්‍රියාදාමයන්ගේ ප්‍රතිඵලයක් ලෙස මෙම අවධානම් ඇතිවේ.

සංවිධානය තුල යහපත් සහ මනා ලෙස පාලනය කරන ලද ක්‍රියාකාරී පරිසරයක් ලබාදීම සඳහා සැකසුණු ව්‍යුහයන්ගෙන් සහ පුළුල් ප්‍රතිපත්තීන් සහිත පද්ධතියකින් සැකසුන කාලීනව සිදුවන අවධානම් පාලනය කරමින් පවත්වාගෙන යන ආයතනයක් ලෙස ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වේ.

උද්ධමනය ඉහල යාමත් සමග පාරිභෝජන වියදම් ඉහලයාම හේතුවෙන් පුද්ගල ඉතිරිකිරීම් පහල යාම හේතුවෙන් ණය ආපසු ගෙවීම අඩුවීමත් , ඒ තුලින් සංවර්ධන වැඩසටහන් වලට කරන අහිතකර බලපෑම් හා නිවාස ඉදිකිරීමේදී අපේක්ෂිත ප්‍රතිලාභී දායකත්වය නොලැබීමේ අවධානම.

ඵලදායි ක්‍රියාකාරී අවධානම් කළමනාකරණය සඳහා විශේෂ පියවර කීපයක් ගෙන ඇත.

- තොරතුරුවල සුරක්ෂිතභාවය ආරක්ෂා කරමින් සියළුම දිස්ත්‍රික් කාර්යාලවලින් ලබාගත් කාලානුරූප දත්ත විශ්ලේෂණය හා වාර්තාකරණය
- තොරතුරු ආරක්ෂා කිරීමේ ප්‍රතිපත්තීන් සහ දැනුවත් කිරීමේ වැඩසටහන්
- නිවාස වැඩසටහන් නිරතුරුවම සමාලෝචනය සහ වැඩිදියුණු කිරීම.
- ණය නැවත අයකිරීමේ වැඩ සටහන් වල ක්‍රියාකාරීත්වය
- ආයතනියක මූල්‍ය දායකත්වය සහිතව ක්‍රියාත්මක නිවාස වැඩ සටහන් වල උපරිම ඵලදායිකත්වය හා කාර්යක්ෂමතාවය ලබාගැනීමට වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.

මෙහෙයුම් අවධානම් පාලනය කිරීම මධ්‍යම කළමනාකරණයේ ප්‍රධානම වගකීම වේ. පාලිත පරිසරයන්හි අනන්‍යභාවය පවත්වා ගැනීම සඳහා මුදල්, විගණන හා අනෙකුත් සහායක සේවා අංශ මගින් මහඟු කාර්යයක් ඉටු කරයි.

වටිනා දේපල ප්‍රමාණයක් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සතුව ඇති හෙයින් යෝග්‍ය උපක්‍රම භාවිතා කිරීම සහ නිරන්තර සමාලෝචනය සහ කාර්යය මණ්ඩලයේ කැපවීම මගින් තරඟකාරී පරිසරය තුල ආයතනයේ සාර්ථකත්වය සඳහා ආයතනික අරමුණු වලට අනුව එම දේපළ ඵලදායිව හා කාර්යක්ෂමව යොදා ගත හැකිය.

පාරිසරික ගැටළු


මධ්‍යම පාන්තික නිවාස ව්‍යාපෘති , අනෙකුත් නිවාස ව්‍යාපෘති ඉදිකිරීමට ප්‍රථම රාජ්‍ය ආයතන, මධ්‍යම පරිසර අධිකාරිය, ගොඩනැගිලි පර්යේෂණ අදාළ පළාත් පාලන ආයතන වැඩ නිර්දේශ වලට අනුව පරිසර සංවර්ධන වැඩ පිලිවෙල ක්‍රියාත්මක කරමින් පරිසරයට අවම හානියක් වන ආකාරයට හා පරිසරයට ගැලපෙන ව්‍යෘපෘති ආරම්භ කිරීමට කටයුතු කර ඇත.

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය ජනතාවට සුරක්ෂිත හා යහපත් පරිසරයක් සපයා දෙනු ලැබේ. ඒ අතරම පානීය ජලය, ප්‍රමාණවත් පිවිසුම් මාර්ග , අඛණ්ඩ විදුලි සැපයුම, වැසි ජලය අපවිත්‍ර ජලය බැහැර කිරීමේ පද්ධති, ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම් වැනි යටිතල පහසුකම් ද සපයනු ලැබේ.

සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ නීති රීති මගින් සහාධිපත්‍ය දේපලවල පදිංචිකරුවන්ට වඩා යහපත් පරිසරයක් සහතික කිරීම.

නිවාස වැඩසටහන් හා ව්‍යාපෘති සැලසුම් කිරීමේදී පාරිසරික සංවේදි කලාපවල හා ස්වභාවික විපත් විශේෂයෙන් නාය යාමේ අවධානම සහිත ප්‍රදේශ , ගංවතුරෙන් හා සුනාමි අවධානම් ඇති ප්‍රදේශ මෙන්ම උග්‍ර ජල හිඟ ඇති කඳුකර ප්‍රදේශවල නිවාස ඉදිකිරීමේදී ඇති අවධානම.

ආයතනයේ සංවිධාන ව්‍යුහය



3 මෙහෙයුම් ක්‍රියාකාරකම් වාර්තාකරණය

නිවාස සංවර්ධන කොට්ඨාසය

"ඔබට ගෙයක් රටට හෙටක් "නිවාස ආධාර වැඩ සටහන

පරමාර්ථය

අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ රට හඳන සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශය තුල ඵලදායි පුරවැසියෙක් සහ සතුටින් ජීවත් වන පවුලක් නිර්මාණය කිරීම සඳහා සෑම පවුලකටම සුව පහසු නිවසක් අත්කර දීම තුළින් සාර්ව ආර්ථික ඉලක්ක සපුරා ගැනීමේ අරමුණට ලගාවීමේ පළමු පියවර ලෙස ගරු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ සංකල්පය හා මාර්ගෝපදේශකත්වය හා නියෝග අනුව දිවයිනේ අඩු ආදායම්ලාභී පවුල්වල නිවාස ගැටලුව විසඳීම සඳහා 2020 නිවාස ඒකක 14022 ක් ඉදිකරදීමේ අරමුණින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතියකි.

කාර්යයභාරය

ඉහත වැඩ සටහන ක්‍රියාත්මක කිරීම සකස් කල අත්වැලෙහි ප්‍රතිලාභීන් තෝරා ගැනීමේ නිර්ණායකයන්ට අනුව ප්‍රමුඛතාවය ලබාදිය යුතු පරිදි තෝරාගත් ප්‍රතිලාභීන්ගේ නාම ලේඛනය කමිටුවේ පොදු එකගතාවය පරිදි නිසි ප්‍රමුඛතාවයද සටහන් කරමින් ප්‍රාදේශීය සංවර්ධන කමිටුව වෙත ඉදිරිපත් කිරීම සඳහා අදාල ප්‍රාදේශීය ලේකම් වෙත ඉදිරිපත් කිරීම ග්‍රාම නිලධාරි විසින් සිදුකර ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය සඳහා අවශ්‍ය අනුමැතිය ලබාදීම පිණිස ප්‍රාදේශීය නිවාස කමිටු රැස්වීම පවත්වා ප්‍රමුඛතා ගත කරන නාම ලේඛනය සඳහා අනුමැතිය ලබාගැනීම සිදුකරනු ලබයි.

අනුමත කරනු ලබන ප්‍රතිලාභීන්ගේ නාම ලේඛනය වැඩ සටහන ආරම්භ කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ලබා ගැනීම පිණිස නොපමාව දිස්ත්‍රික් ලේකම් වෙත සහ නිවාස සංවර්ධන අධිකාරියේ දිස්ත්‍රික් කළමනාකරු වෙත ඉදිරිපත් කරනු ලබයි.

තෝරාගත් ප්‍රතිලාභීන් සඳහා එක් ග්‍රාම නිලධාරි වසමකට එක් නිවසක් බැගින් දින 60 ක් තුල අදාළ නිවස ඉදිකිරීම මෙහි අරමුණයි. (2020 වර්ෂය සඳහා නිවාස ඉලක්කය 14022 කි.)

මෙම වැඩ සටහන ජාතික මට්ටම සමග සම්බන්ධීකරණය කරමින්, සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වෙත ප්‍රතිපාදන වෙන් කිරීම සඳහා දිස්ත්‍රික් සංවර්ධන කමිටු සභාපතිවරයාගේ එකගතාවය මත දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ අධීක්ෂණය යටතේ දිස්ත්‍රික් නිවාස කමිටුව හරහා ක්‍රියාත්මක කිරීමට ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ දිස්ත්‍රික් කළමනාකරු විසින් පියවර ගනු ලැබේ.

වැඩ සටහන ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේදි, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදි සහ දිස්ත්‍රික් නිවාස කමිටුවේදි ප්‍රගතිය සමාලෝචනය කිරීමට ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ දිස්ත්‍රික් කළමනාකරු විසින් කටයුතු කරනු ලබන අතර, ජාතික මට්ටම වෙත නියමිත පරිදි ප්‍රගතිය වාර්තා කිරීම සඳහා දිස්ත්‍රික් ලේකම්වරුන්, ප්‍රාදේශීය ලේකම්වැරුන් සහ ආදාළ නිළධාරින්ගේ සහයෝගය ලබාගෙන සාර්ථකව ක්‍රියාත්මක කිරීමේ කටයුත්ත අදාළ දිස්ත්‍රික්කයන්හි දිස්ත්‍රික් කළමනාකරුවන් විසින් සිදු කරනු ලබයි.

2020.12.31 දිනට භෞතික හා මූල්‍ය ප්‍රගතිය

2020 වර්ෂයේ ඉලක්කගත නිවාස ඒකක 14022 න් නිවාස ඒකක 9972 ක වැඩ ආරම්භ කර 2020.12.31 දිනට ඉන් නිවාස ඒකක 4027 ක වැඩ අවසන් කර ඇත. 2020 වර්ෂයේ ආරම්භ කරන ලද නිවාස ඒකක වලට අදාළ ඇස්තමේන්තු මුදල රු. මිලි. 5983.200 ක් වන අතර ඉන් 2020.12.31 දිනට වැය කල මුදල රු. මිලි. 4119 කි.

"ඔබට ගෙයක් -රටට හෙටක් " විසිරි නිවාස ණය වැඩසටහන

වැඩ සටහනේ පමාර්ථය

ස්ථීර නව නිවසක් නොමැති පවුල් ඒකක සඳහා නව නිවසක් ඉදිකිරීම හා ස්ථීර නිවසක් ඉදිකර ඇතත් වැඩ අවසන් නොවූ ඉදිකිරීම්වල වැඩ අවසන් කර ගැනීම, වැඩ නිම කර ඇති නිවාසවල අලුත් වැඩියා කටයුතු කිරීම හා ස්ථීර නිවසට අලුතින් කොටසක් එකතු කිරීම සඳහා සහායවීම මූලික පරමාර්ථ වශයෙන් පදනම් කරගෙන පවුල් ඒකකයක් වෙත අංග සම්පූර්ණ නිවසක ජීවත් වීමට අවස්ථාව සලසා ගැනීමේ අභිමාතාර්ථය මුදුන් පැමිණවීම.

මෙම සංවර්ධන කාර්යයයේ උපාය හා මූලික පරමාර්ථ වනුයේ

- නිවසක් නොමැති ඉඩමක් හිමි ආර්ථික හැකියාවක් ඇති අය වෙනුවෙන් ඔවුන්ගේම නිවසක අවශ්‍යතාවය සඳහා දිරි ගැන්වීම.
- නිවසක අවශ්‍යතාවය සපුරා ගැනීමට ආර්ථික හැකියාවක් නොමැති නමුත් නිවසක අවශ්‍යතාව ඇති පවුල් ඒකක වලට තමන්ගේම නිවසක ජීවත්වීමේ අභිලාශය මුදුන් පැමිණවීම.
- එකම කුටුම්භයක පවුල් ඒකක කිහිපයක් ජීවත් වන , තමන්ගේම නිවසක ජීවත්වීමේ අභිලාශය ඇති, නමුත් දැනුම නොතිබීම, ඉඩමක හිමිකම නොමැතිවීම, ආරක්ෂිත නිවසක් ඉදිකර ගැනීමට හැකියාවක් නොතිබීම වැනි අවස්තාවලදී ඔවුන්ගේ නිවාස සිහිනය මුදුන්පත් කිරීම.
- ප්‍රජා සහභාගිත්වය දායකකර ගනිමින් ප්‍රජා පාදක ක්‍රමවේද ගුරු කොට ගෙන ශ්‍රී ලංකාවේ නිවාස ක්ෂේත්‍රයේ වර්ධනයක් ඇති කිරීම.
- නිවාස ලාභි පවුල් වෙත තම නිවාස ඉදිකර ගැනීම සඳහා තාක්ෂණික උපදෙස් ලබා දීම හා ඉදිකිරීම් සුපරීක්ෂාකාරීත්වය තුළින් ප්‍රතිලාභින් වෙත සහාය ලබාදීම හා එමගින් ප්‍රමිතිගත නිවාස ඉදිකරවීම.
- නිවාසලාභි ප්‍රජාවගේ කැපවීම හා නිර්මාණශීලිත්වයන්ට අවශ්‍ය කරන දිරිගැන්වීම් ලබාදීම, මගපෙන්වීම හා සහායදීම.
- නිවාස ඉදිකිරීම් ක්ෂේත්‍රයේ හවුල්කාර ආයතනවල දායකත්වයෙන් ඒකාබද්ධ වැඩ සටහනක් ලෙස මෙම වැඩ සටහන සැලසුම් කිරීම හා ක්‍රියාවට නැංවීම.
- දිස්ත්‍රික් , ප්‍රාදේශීය හා ගම් මට්ටම දක්වා විමධ්‍යගත ක්‍රමවේදය මත ක්‍රියාත්මක කිරීම.

වැඩ සටහනේ කාර්යයභාරය

වර්ථමාන , සමාජ ආර්ථික ජීවන රටාව තුළ පදිංචිය සඳහා සුදුසු නිවසක් ඉදිකරගැනීම සඳහා සත්‍ය වශයෙන්ම ආර්ථික හැකියාව ඉතා අවම , එහෙත් ඉදිකිරීම් ආරම්භ කරන ලද නිවසේ වැඩ අවසන් නැති හෝ අබලන් නිවස අලුත් වැඩියා කර ගැනීම සඳහා හෝ දැනට ඇති නිවසට කොටසක් එක්කරගැනීමේ අවශ්‍යතාවය ඇති පවුල් මේ සඳහා තෝරා ගැනේ. මෙම වැඩ සටහන දිවයිනේ සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ පාදක කොටගනිමින් ක්‍රියාත්මක කෙරේ. එහිදී

නව නිවාස ණය වැඩසටහන

උපරිම මාසික ආදායම රු. 75,000/- ක් හෝ ඊට අඩු ආදායම් සහිත ප්‍රතිලාභින් හට නව නිවසක් ඉදිකර ගැනීමේ අවශ්‍යතාවය මත රු. 500,000/- සිට රු. 1,000,000/- ක ණය මුදලක් වසර 5 හා 10 ක කාල සීමාවක් තුළ 6% සිට 9% ක වාර්ෂික පොළී ප්‍රතිශතයක් යටතේ ලබා ගත හැක.

ණය මුදල අනුමත කිරීමට පෙර නිවසේ වැඩ නිම කරගැනීමට ඇති හැකියාව පිළිබඳ අවශ්‍ය තාක්ෂණික වාර්තා ලබාගැනීමට අවධානය යොමු කිරීම දිස්ත්‍රික් කළමනාකරුගේ කාර්යය භාරය වේ.

වැඩි දියුණු නිවාස වැඩ සටහන

උපරිම මාසික ආදායම රු. 75,000/- ක් හෝ ඊට අඩු ආදායම් සහිත ප්‍රතිලාභින් හට වැඩිදියුණු නිවසක් ඉදිකර ගැනීමේ අවශ්‍යතාවය මත රු. 300,000/- දක්වා උපරිම ණය මුදලක් වසර 5 හා 10 ක කාල සීමාවක් තුළ 6% සිට 7% ක වාර්ෂික පොළී ප්‍රතිශතයක් යටතේ ලබා ගත හැක. ණය මුදල අනුමත කිරීමට පෙර නිවසේ වැඩ නිම කරගැනීමට ඇති හැකියාව පිළිබඳ අවශ්‍ය වාර්තා ලබාගැනීමට අවධානය යොමු කිරීම දිස්ත්‍රික් කළමනාකරුගේ කාර්යය භාරය වේ.

උදා ගම්මාන වැඩ සටහන (ආදර්ශ ගම්මාන)

අවිච්ඡේද ගම්මාන වැඩ සටහන යටතේ නිවාස ඒකක 262 ක වැඩ නිමකර ඇත. අවිච්ඡේද නිවාස 1046 ක් සඳහා රු. මිලියන 165.839 ක මුදලක් නිකුත් කර ඇති අතර, ඒ අනුව නිම නොකල නිවාස 2021 වසර තුල තවදුරටත් ප්‍රතිපාදන යොදවා නිම කිරීමට සැලසුම් කර ඇත.

පාස්කු ප්‍රහාරයෙන් විපතට ලක් වුවන්ගේ පවුල් සඳහා වූ නිවාස වැඩ සටහන

2019.04.21 දින ත්‍රස්ත ප්‍රහාරයට ලක් වූ කොච්චි කඩේ ශාන්ත අන්තෝනි දේවස්ථානය, මීගමුව කටුවාපිටිය ශාන්ත සෙබස්තියන් දේවස්ථානය සහ මඩකලපුව සියොන් දේවස්ථානය යන දේවස්ථානයට එල්ල කල ත්‍රස්ත ප්‍රහාරයෙන් බැතිමතුන් 264 කට අධික සංඛ්‍යාවක් ජීවිතක්ෂයට පත්වී තවත් විශාල සංඛ්‍යාවක් තුවාල ලබන ලදි.

මෙම ත්‍රස්ත ප්‍රහාරයෙන් විපතට පත් පවුල් ඔවුන් පත්ව සිටින අසරණ තත්වයෙන් හා මානසික ව්‍යාකූලත්වයෙන් ගොඩගැනීමේ අරමුණින් ඔවුන්ගේ නිවාස සංවර්ධන අවශ්‍යතාවයන් පිළිබඳ සොයාබලා මූල්‍යාධාර ලබාදී අදාල නිවාස අවශ්‍යතාවය සපුරා දීම වෙනුවෙන් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මගින් ඉහත නිවාස වැඩ සටහන ක්‍රියාත්මක වේ.

මෙම වැඩ සටහන යටතේ 2020 වර්ෂයේ නිවාස 275 ක් ඉදිකිරීම සඳහා රු. මිලි. 282.752 ක මුදලක් ඇස්තමේන්තු ගත කර තිබුනු අතර, ඉදිකිරීම සිදුවන නිවාස 194 ක් සඳහා රු. මිලි. 26.204 ක් වැය කර ඇත.

ඉන්දියානු ආධාර ආදර්ශ ගම්මාන වැඩ සටහන

මෙම වැඩ සටහන යටතේ ඉන්දියානු රජයේ අරමුදල් භාවිතයෙන් අඩු ආදායම්ලාභී පවුල් 2400 ක් සඳහා එක් පවුලකට එක් නිවසක් බැගින් නිවාස ඉදිකිරීම වෙනුවෙන් රු. ලක්ෂ 5 ක නිවාස ආධාරයක් ලබාදීම සිදුවේ.

ඒ යටතේ 2019 වසරේ අවිච්ඡේද වූ නිවාස 1775 ක් සඳහා ඇස්තමේන්තුගත මුදල රු. මි. 428.725 ක් වන අතර, ඉන් රු. මිලි. 36.220 ක ආධාර මුදලක් ප්‍රතිලාභීන් වෙත නිදහස් කර ඇත. නිම නොකල නිවාස 2021 වසර තුල ඉදිරි ප්‍රතිපාදන යොදවා නිම කිරීමට සැලසුම් කර ඇත.

දේපළ කළමනාකරණ කොට්ඨාශය

මෙම අධිකාරියට අයත් නිවාස ක්‍රමවල නිවාස හා ඉඩම් බැහැර කිරීම සඳහා ජාතික නිවාස සංවර්ධන අධිකාරිය පනතේ 8/1 වගන්තියට අනුව අනුමැතිය ලබා ගැනීමට දිස්ත්‍රික් කාර්යාල මගින් 2020 වර්ෂය තුල යොමු කරන ලද ප්‍රතිලාභීන්ගේ ලිපිගොණු සංඛ්‍යාව 1634 කි. ඒ අතරින් පරීක්ෂාවට ලක්කර ගරු අමාත්‍යතුමාගේ අනුමැතිය ලබාගෙන දිස්ත්‍රික් කාර්යාල වෙත ඔප්පු සකස් කිරීම සඳහා යොමු කල ලිපි ගොණු සංඛ්‍යාව 1008 කි.

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වෙත නිවාස සංවර්ධන කටයුතු සඳහා ඉඩම් පවරා ගැනීම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

- ❖ රජයේ ඉඩම් පවරා ගැනීම.
- ❖ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩම් පවරා ගැනීම.
- ❖ ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ ඇති බලතල ප්‍රකාරව ටෙන්ඩර් පටිපාටියට අනුව පුද්ගලික ඉඩම් පවරා ගැනීම.
- ❖ වෙනත් රාජ්‍ය ආයතන සතු පෞද්ගලික ඉඩම් පවරා ගැනීම.
- ❖ දේපල කළමනාකරණ කොට්ඨාශය වෙත 2020 වර්ෂය තුල 6460 ක ලිපි ප්‍රමාණයක් ලැබී ඇති අතර, පවතින චක්‍රලේඛ උපයෝගි කර ගෙන දේපල කළමනාකරණ ගැටළු සඳහා විසඳුම් ලබාදීම සහ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක 76 යොමු කර අධ්‍යක්ෂ මණ්ඩල තීරණ 69 ක් ලබා ගෙන ඉදිරි කටයුතු සිදු කර ඇත.

ඉලක්ක සපුරා ගැනීම

- ➢ 2020 වර්ෂයේදී ඉඩම් 05 ක හිමිකම ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වෙත පවරා ගෙන ඇත.
- ➢ රජයේ ඉඩම් අඥා පනත යටතේ දීමනා පත්‍ර මගින් පවරා ගත යුතු ඉඩම් 296 ක කටයුතු දැනටමත් නිම වෙමින් පවතී.
- ➢ 2020 වර්ෂය තුල ඉඩම් අත්පත් කර ගැනීමේ පනතට අනුව 44 වන ගන්තිය යටතේ සහතිකය මගින් ඉඩම් 02 ක් පවරා ගෙන ඇත
- ➢ 44 වගන්තිය ලබා ගැනීම සඳහා සම්පූර්ණයෙන් වන්දි හා පොලි ගෙවා අවසන් කරන ලද , ඉඩම් ගණන 01 කි.
- ➢ ඉඩම් හිමිකම් පරීක්ෂණ අවසන් කර අදාළ ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් ඉඩම් අත්පත් කිරීමේ පනතේ 17 වන වගන්තිය යටතේ වන්දි හා පොලි ගෙවීමට ඉඩම් 15 ක් සඳහා ප්‍රතිපාදන ඉල්ලුම් කර ඇත.
- ➢ 2020 වසරේදී ඉඩම් 03ක් සඳහා වන්දි, වන්දි පොලි, මූලික තැන්පතු වශයෙන් රුපියල් 3,277,167.17 ක මුදලක් ගෙවා ඇත.
- ➢ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩම් සඳහා වන්දි ගෙවීමෙන් අනතුරුව ඉඩම් 18 ක අයිතිය ලබා ගැනීම සඳහා අවසන් අදියරට පැමිණ ඇත.
- ➢ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩම් සඳහා තවදුරටත් වන්දි ගෙවීමටත්, වන්දි ගෙවා ඇති ඉඩම් ගැටළු 65 ක් හඳුනා ගෙන එම ඉඩම් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වෙත පවරා ගැනීමට අදාලව ඉදිරි කටයුතු සිදු කරමින් පවතී.
- ➢ රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති වලට අදාල ලබාදී ඇති ඉඩම් සඳහා ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වෙත වන්දි ලබා ගැනීම සම්බන්ධ ඉදිරි කටයුතු සිදු කරමින් පවතී.

2020 වර්ෂයේදී මැණුම් අංශය මගින් සිදු කරන ලද රාජකාරී පහතින් දැක්වේ.

අනු අංකය	මැ. නි. අංකය	දිනය	දිස්ත්‍රික්කය	ඉඩමේ නම	පිඹුරු අංකය	කාර්යය	ප්‍රමාණය			
							අක්.	රූ.	පර්.	හෙක්.
1	8/5/2/2/63ii	2020.06.03	කොළඹ	සොයිසාපුර	765	මධ්‍ය පාන්තික නිවාස ක්‍රම සඳහා	0	1	3.49	0.11
2	8/5/2/1/න/234i	2020.06.12	කොළඹ	ඇන්ඩර්සන්	766	මධ්‍ය පාන්තික නිවාස ක්‍රම සඳහා	0	1	16.36	0.14255
3	8/5/2/5/151	2020.06.11	කොළඹ	වොක්ෂෝල්විදිය	773	මධ්‍ය පාන්තික නිවාස ක්‍රම සඳහා	0	3	10.55	0.3302
4	8/5/2/1/න/108	2020.06.10	කොළඹ	ෂෙඩ්වත්ත - මාළිගාවත්ත	782A	මධ්‍ය පාන්තික නිවාස ක්‍රම සඳහා	0	1	26.94	0.1693
5	8/5/2/1/න/108	2020.07.06	කොළඹ	මාළිගාවත්ත - ප්‍රදීපාශාලා 1 සහ 2 අයත් ඉඩම	789	මධ්‍ය පාන්තික නිවාස ක්‍රම සඳහා	1	3	11.87	0.73843
6	8/5/2/2/100ii	2020.07.02	කොළඹ	මත්තේගොඩ කොා 145A/260 කොටසක්	842	මධ්‍ය පාන්තික නිවාස ක්‍රම සඳහා	0	1	23.38	0.1603
7	8/5/2/2/100ii	2020.06.14	කොළඹ	මත්තේගොඩ බුදු මැදුර අසල ඉඩම	587A	මධ්‍ය පාන්තික නිවාස ක්‍රම සඳහා	0	3	29.52	0.3782
8	8/5/2/2/100ii	2020.	කොළඹ	මත්තේගොඩ 842 සමෝච්ච රේඛා මැනීම	928/1	මධ්‍ය පාන්තික නිවාස ක්‍රම සඳහා සමෝච්ච රේඛා මැනීම	0	1	23.38	0.1603
9	8/5/2/1/17	2020.09.30	කොළඹ	එල්ස්ටන්වත්ත මු. පි. කොා. 7211/3,4&5	905	අනුබෙදුම් කිරීම	0		9.01	0.0228
10	8/5/2/2/23ii	2020.08.24	කොළඹ	එත්තිනාමාතාගම මු. පි. කොා. 7339/37	831	අනුබෙදුම් කිරීම	0		24.94	0.0631
11	8/5/2/1/179	2020.07.21	කොළඹ	පරංගියාකුඹුර කිරිමණ්ඩල මාවත	මු. පි. කොා. 5722	මායිම් නිරවුල් කර ගැනීම	5		0	2.023428
	8/5/2/1/179	2020.12.08	කොළඹ	පරංගියාකුඹුර කිරිමණ්ඩල මාවත	927	අනුබෙදුම් කිරීම	1		1.19	0.4077
12	8/5/2/1/35ii	2020.07.11	කොළඹ	රණාල වලව්වත්ත	899	ඒකාබද්ධ කිරීම	0		11.05	0.02794
13	8/5/2/8/74	2020.	අනුරාධපුර	දහයියාගම නිලනිවාස ඉඩම	262C	වට මැනීම	3		15.51	1.2533
14	8/5/3/14/114	2020.11.24	අනුරාධපුර	දිස්ත්‍රික් කාර්යාල ඉඩම	988-නව	වට මැනීම	0	1	25.06	0.1646
15	8/5/2/20/104	2020.07.13	හම්බන්තොට	තංගල්ල මහල් නිවාස ව්‍යාපෘතිය		සහාධිපත්‍ය පිඹුර සකස් කල යුතුයි				0.4881
16	8/5/2/2/202		ගම්පහ	වැරැල්ල වත්ත	2549	මායිම් නිරවුල් කිරීම				2.327
17	8/5/2/3/පොදු	2020.08.12	කළුතර	හෑගල්ලවත්ත	989	කැබැලි සැලැස්ම	1	3	25.03	0.7715

ඉංජිනේරු සේවා හා ඉදිකිරීම් කොට්ඨාසය

ඉංජිනේරු සේවා හා ඉදිකිරීම් කොට්ඨාසය පහත අංශ වලින් සමන්විත වේ.

- ඉංජිනේරු අංශය
- වාස්තු විද්‍යා අංශය
- ප්‍රමාණ සමීක්ෂණ අංශය
- සැළසුම් අංශය
- විදුලි අංශය
- නඩත්තු අංශය
- ව්‍යාපෘති අංශය
- පාලන අංශය
- පරිශ්‍ර අංශය

2020 වර්ෂය තුලදී පහත සඳහන් වැඩසටහන් මගින් සියළු ජන කොටස් වල නිවාස අරමුණු හා ඒ සම්බන්ධ ගැටළු නිරාකරණය කිරීමට කටයුතු කර ඇත.

2020 වර්ෂයේ ක්‍රියාත්මක ව්‍යාපෘති

01. නගමු පුරවර - (නව)

	ව්‍යාපෘතිය	ප්‍රතිලාභී පවුල් සංඛ්‍යාව	ප්‍රගතිය 2020.12.31 දිනට		වෙනත්
			භෞතික	මූල්‍ය	
1	සොයිසාපුර නිවාස ක්‍රමයේ අංක A/3/1/4 නිවසෙහි ජල රෝධනය කිරීම	01	100%	0.39	අවසන් බිල පරීක්ෂා කරමින් පවතී
2	සාමපුර ගොඩනැගිලි වල ජල ටැංකි නවීකරණය	-	100%	0.47	බිල් ගෙවා අවසන් කර ඇත

02. ගම්පෙරළිය (අවිච්ඡේද)

	ව්‍යාපෘතිය	ප්‍රතිලාභී පවුල් සංඛ්‍යාව	ප්‍රගතිය 2020.12.31 දිනට		වෙනත්
			භෞතික	මූල්‍ය	
1	මව්ලානාවත්ත නිවාස ක්‍රමය අදියර 1 අදියර 11	 62 56	 100% 100%	 25.05 21.87	අවසන් බිල පරීක්ෂා කරමින් පවතී
2	ශාන්ත ජේම්ස් වීදිය නිවාස ක්‍රමය	180	100%	43.98	ගෙවා අවසන්
3	නිව්හැම් නිවාස ක්‍රමය	105	11%	9.99	කොන්ත්‍රාත්කරුගේ මන්දගාමී ප්‍රගතිය හේතුවෙන් ව්‍යාපෘතිය නතර කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලයට යොමු කර ඇති අතර තීරණය ලැබී ඇත. ඒ අනුව දෙපාර්ෂවයේ එකඟතාවය පරිදි ව්‍යාපෘතිය නතර කිරීමට කටයුතු කරමින් පවතී.

3. නගමුපුරවර මහල් නිවාස නවීකරණය (අවිච්ඡේද)

	ව්‍යාපෘතිය	ප්‍රතිලාභී පවුල් ගණන	ප්‍රගතිය 2020.12.31 දිනට		වෙනත්
			භෞතික	මූල්‍ය	
1	මැද මාවත (Central road) නිවාස ක්‍රමය අළුත්වැඩියාව	48	100%	14.11	අවසන් බිල පරීක්ෂා කරමින් පවතී
2	ශාන්ත සෙබස්තියන් නිවාස ක්‍රමයේ A,B,C ගොඩනැගිලි සහ ප්‍රජා ශාලාව අළුත්වැඩියාව	95	100%	32.73	ගෙවීම් සඳහා බිල්පත මුදල් අංශයට යොමු කර ඇත
3	මොහිදීන් මස්ජීඩ් නිවාස ක්‍රමයේ D ගොඩනැගිල්ලේ නිවාස 8 හි වැසිකිළි අළුත්වැඩියාව	08	100%	0.96	ගෙවීම් සඳහා බිල්පත මුදල් අංශයට යොමු කර ඇත
4	කාක දූපත නිවාස ක්‍රමයේ ප්‍රජා ශාලාව නවීකරණය, කාණු පද්ධතිය අළුත්වැඩියා කිරීම	353	100%	0.63	අවසන් බිල පරීක්ෂා කරමින් පවතී
5	ෆෝබස්ලේන් නිවාස ක්‍රමයේ පවතින වැසිකිළි හා නාන කාමර නවීකරණය (ගොඩනැගිලි F,G)	32	100%	3.87	කොන්ත්‍රාත්කරු අවසන් බිල ඉදිරිපත් කර නැත
6	ඇන්ඩර්සන් නිවාස ක්‍රමයේ V සහ W ගොඩනැගිලි වල වැසිකිළි අළුත්වැඩියාව	16	100%	2.17	අවසන් බිල පරීක්ෂා කරමින් පවතී
7	නාරාහේන්පිට මෙල් වත්ත නිවාස ක්‍රමයේ මළ නාලිකා පද්ධතිය වැඩිදියුණු කිරීම සහ වෙනස්කම් සිදු කිරීම	96			නගර සභාව විසින් අවබෝධතා ගිවිසුම අත්සන් කර එවා නොමැති බැවින් ක්‍රියාත්මක වී නැත
8	මැල් වත්ත අඩු ආදායම් නිවාස ක්‍රමයේ ඉතිරි අළුත්වැඩියාවන් සිදු කිරීම	1792	100%		අවසන් බිල ගෙවීමට ඇත
9	සාංචිආරච්චිවත්ත නිවාස ක්‍රමයේ ගොඩනැගිලි 7 අළුත්වැඩියා කිරීම	224	100%	7.06	ගෙවීම් සඳහා බිල්පත මුදල් අංශයට යොමු කර ඇත
10	මැනිං ටවුන් නිවාස ක්‍රමයේ BP ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීම	40	100%	8.47	වැඩ ප්‍රමාණය 10% ඉක්මවා යාම හේතුවෙන් ප්‍රසම්පාදන අනුමැතිය ලැබෙන තෙක් අවසන් බිල ගෙවීමට නොහැකිව පවතී
11	මිහිදු මාවත නිවාස ක්‍රමයේ B සහ C ගොඩනැගිලි අළුත්වැඩියාව	24	100%	2.88	අවසන් බිල පරීක්ෂා කරමින් පවතී
12	ගෝතමීපුර නිවාස ක්‍රමයේ මළ නාලිකා පද්ධතිය අළුත්වැඩියාව අදියර II	48		-	ජනතා විරෝධය මත ක්‍රියාත්මක වී නැත
13	නිවාස ක්‍රම වල පොම්පාගාර නඩත්තු	-		4.50	සෘජු මිලදී ගැනීම්
14	මැනිං ටවුන් නිවාස ක්‍රමයේ ගොඩනැගිලි 7 හි නවීකරණය	35	100%	8.01	අවසන් බිල පරීක්ෂා කරමින් පවතී
15	ජයවඩනගම පොකුණ නවීකරණය	-	100%	4.09	අවසන් බිල පරීක්ෂා කරමින් පවතී
16	797 වත්ත නිවාස ක්‍රමයේ අදියර iv ගොඩනැගිල්ලේ ජල ටැංකි ආවරණය	16	100%	0.53	කොන්ත්‍රාත්කරු අවසන් බිල ඉදිරිපත් කර නැත
17	අබ්දුල් හමීඩ් නිවාස ක්‍රමයේ ගොඩනැගිලි 4 ක ජල රෝදනය කිරීම	56	100%	11.76	කොන්ත්‍රාත්කරු අවසන් බිල ඉදිරිපත් කර නැත
18	ජල්තර මළ නාලිකා පද්ධති අළුත්වැඩියාව		100%	0.95	බිල් ගෙවා අවසන් රැඳවුම් මුදල ගෙවීමට ඇත

අභ්‍යන්තර උත්පාදන යටතේ සිදු කර ඇති ව්‍යාපෘති 2020

	කොන්ත්‍රාත්තුව	කොන්ත්‍රාත් මුදල රු. මිලි' (වැට් රහිත)	කොන්ත්‍රාත්තුව ආරම්භ කල දිනය	කොන්ත්‍රාත්තුව අවසන් කල දිනය	වෙනත්
1	මැනිං ටවුන් කාර්යාලයේ ප්‍රධාන පරිශ්‍රය ටයිල් කිරීම.	925,000.00	2020.10.09	2020.10.22	ගෙවීම් කර නොමැත
2	මැනිං ටවුන් කාර්යාලයේ ඇළුමිනියම් පාර්ටිෂන් සිදු කිරීම.	799,650.00	2020.10.15	2020.10.28	ගෙවීම් කර නොමැත
3	මැනිං ටවුන් කාර්යාලයේ තීන්ත ආලේප කිරීම.	486,800.00	2020.10.23	2020.11.05	කොටසක් ගෙවා ඇත. රු. 367,856.90

4. පෙර විකුණුම් මහල් නිවාස ව්‍යාපෘති

(i) මහල් 5 කින් හා නිවාස 30 කින් යුත් මෙම නිවාස ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්කරු ලෙස රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව ක්‍රියා කරයි.

	ව්‍යාපෘතිය	ප්‍රතිලාභී පවුල් ගණන	භෞතික ප්‍රගතිය 2020.12.31 දිනට
1	තංගල්ල නිවස ව්‍යාපෘතිය	30	15%

(ii) මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතීන් සහ මධ්‍යම පාන්තික නිවාස ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතීන් ලැබී ඇති අතර පහත ව්‍යාපෘති සඳහා 2020 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත.

- සොයිසාපුර මධ්‍යම පාන්තික නිවාස ව්‍යාපෘතිය
- වැරැල්ලවත්ත මධ්‍යම පාන්තික නිවාස ව්‍යාපෘතිය

පහත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය නාගරික සංවර්ධන අධිකාරිය, පලාත් පාලන ආයතනය සහ අනෙකුත් ආයතන අනුමැතීන් ලබා ගැනීමට ක්‍රියා කර ඇත.

- කොහොලන්කල අඩු ආදායම් හා මධ්‍යම පාන්තික නිවාස ව්‍යාපෘතිය
- සොයිසාපුර මධ්‍යම පාන්තික නිවාස ව්‍යාපෘතිය
- වැරැල්ලවත්ත මධ්‍යම පාන්තික නිවාස ව්‍යාපෘතිය
- අනුරාධපුර දහයියාගම මධ්‍යම පාන්තික නිවාස ව්‍යාපෘතිය

5. රාජ්‍ය පෞද්ගලික ඒකාබද්ධ නිවාස ව්‍යාපෘති

මෙම වැඩසටහන මධ්‍යම පාන්තික නිවාසලාභීන්ගේ නිවාස අවශ්‍යතාවය සපුරාලීම සඳහා පිහිටුවන ලද්දකි. දේශීය / විදේශීය පුද්ගලික ආයතනය සමඟ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය රාජ්‍ය හා පෞද්ගලික ඒකාබද්ධ ගිවිසුමකට එළඹ පෙර විකුණුම් පදනම යටතේ මෙම නිවාස ඉදිකරනු ලැබේ.

	ව්‍යාපෘතිය	ප්‍රතිලාභී පවුල් ගණන	ප්‍රගතිය 2020.12.31 දිනට
1	හන්තාන - අදියර II	82	5.5% නඩු කටයුත්තක් පවතී. උසාවි නියෝගය ලැබීමට යටත්ව නිවාස 11 ක් ඉදිකිරීමට අවසර ලබා දී ඇත. මේ වන විට නිවාස 7 ක් ඉදිකරමින් පවතී.
2	හන්තාන - අදියර III	20	
3	යක්කල, සියනෑ උයන සොබා උයන නිවාස ව්‍යාපෘතිය	42	90%
4	කළුගල පල්ලෙකැලේ රීජන්සි උද්‍යාන නිවාස ව්‍යාපෘතිය අදියර I අදියර II	 11 10	 85% 70%

6. ප්‍රසම්පාදන කටයුතු

- 2020 වර්ෂය තුල නිවාස ක්‍රම වල අත්‍යාවශ්‍ය කටයුතු, සංචාරක බංගලා සහ ප්‍රධාන කාර්යාලය තුල නවීකරණ කටයුතු සඳහා ටෙන්ඩර් කැඳවා ඇති ගණන 17 කි. ව්‍යාපෘති 07 ක් සඳහා කොන්ත්‍රාත් ප්‍රදාන කිරීමේ ලිපි නිකුත් කර ඇත.

7. පහත සඳහන් ව්‍යාපෘති සඳහා සැළසුම් ඇඳීම මෙම කොට්ඨාශයෙන් සිදු කර ඇත.

- අනුරාධපුර දහයියාගම මධ්‍යම පාන්තික නිවාස ව්‍යාපෘතිය
- මත්තේගොඩ මධ්‍යම පාන්තික නිවාස ව්‍යාපෘතිය
- කටුවාපිටිය නිවාස ක්‍රමය
- සොයිසාපුර මධ්‍යම පාන්තික නිවාස ව්‍යාපෘතිය
- මහජන සම්බන්ධතා ඒකකය
- මීට අමතරව අනුරාධපුර දිස්ත්‍රික් කාර්යාලය සහ ප්‍රධාන කාර්යාලයේ කොට්ඨාශ කිහිපයක, පොළොන්නරුව, මාතලේ දිස්ත්‍රික්කයන්හි වෙන් කිරීම් බිත්ති සැළසුම් ඇද ඇත. තවද ජල හා ජල අපවහන පද්ධති, කසල පද්ධති, ප්‍රජා ශාලා, නිවාස ක්‍රමයන්හි බිම් අලංකරණය පිළිබඳ සැළසුම්ද ඇද ඇත.

8. සහාධිපත්‍ය දේපළ

- 2009.12.31 දිනට පෙර පලාත් පාලන අනුමැතීන් ලබා ගැනීමෙන් තොරව ඉදිකරන ලද නිවාස ව්‍යාපෘති සඳහා 2018 අංක 23 දරණ බද්ධ නිවාස අයිතිකම් පනත යටතේ ඔප්පු ලබා දීමට ක්‍රියා කල හැකි අතර ඒ සඳහා ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් නිවාස පරීක්ෂා කිරීමෙන් අනතුරුව ගොඩනැගිලි තත්ව පිළිබඳව නිකුත් කරන සහතිකය පදනම් කර ගනු ලැබේ.

- ඒ අනුව ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු නිළධාරීන් සමඟ සම්බන්ධීකරණය වී නිවාස පරීක්ෂා කිරීම් හා ඉදිරි කටයුතු සිදු කෙරේ.

- 2020.12.31 දින වන විට නිවාස ක්‍රම 22 කට අදාළ පිඹුරු ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට යවා ඇති අතර 13 ක් එහි නිළධාරීන් විසින් පරීක්ෂා කර ඇත. නිවාස ක්‍රම 04 කට වාර්තා එවා ඇති අතර නිති අංශය විසින් සභාධිපත්‍ය පිඹුර හා සභාධිපත්‍ය ප්‍රකාශන, එකී වාර්ථා ඉඩම් ලියාපදිංචි කාර්යාලය වෙත යොමු කර ඇත.

9. පොම්පාගාර නඩත්තු කටයුතු

හිඹුටු උයන හා මුල්ලේරියාව නිවාස ක්‍රමයේ මලාපවාහන නඩත්තු කටයුතු කොන්ත්‍රාත්කරුවෙකු ලවා ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් සිදු කර ඇත.

10. විදුලි නඩත්තු කටයුතු

සේවා අවශ්‍යතාවය අනුව ප්‍රධාන කාර්යාලයේ සහ නිවාස ක්‍රම වල විදුලි නඩත්තු කටයුතු සිදු කර ඇත

මානව සම්පත් කළමනාකරණ කොට්ඨාශය

මිනිස්බල සැලැස්ම ප්‍රකාරව ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මානව සම්පත් කළමනාකරණ හා පාලන කොට්ඨාශයෙහි කාර්යාල ව්‍යුහය සංවිධානය පහත සඳහන් පරිදි වේ.

(අ). මානව සම්පත් සංවර්ධන හා පරිපාලන

1. මානව සම්පත් කළමණාකරණ අංශය
2. පාලන අංශය
3. මාණ්ඩලික නිවාස ණය අංශය
4. පුහුණු හා සංවර්ධන අංශය
5. පුස්තකාලය
6. විනය අංශය
7. ආරක්ෂක අංශය
8. ප්‍රවාහන අංශය
9. මහජන සම්බන්ධතා අංශය

(ආ). සැපයුම් හා ප්‍රවාහන කළමනාකරණ

10. ප්‍රවාහන අංශය
11. සැපයුම් අංශය

(ඇ). තොරතුරු තාක්ෂණ

12. තොරතුරු තාක්ෂණ අංශය

01. මානව සම්පත් කළමනාකරණ අංශය.

ආයතනයේ මිනිස් බල සැලැස්ම ක්‍රමවත්ව ක්‍රියාත්මක කිරීමේ ප්‍රධාන මෙහෙයුම් ඒකකය මානව සම්පත් කළමනාකරණ අංශයයි. මේ මගින් ආයතනික මානව සම්පත් කළමණාකරණයට අදාළ නීතිරීති හා රෙගුලාසි සම්පාදනය කරනවා මෙන්ම අධිකාරියේ පනතේ සඳහන් නියමයන්ට අනුව ආයතනය ඵලදායි ඉලක්ක ගත නිවාස සංවර්ධන වැඩසටහන කරා මෙහෙය වීමට අවශ්‍ය මිනිස් බලය කළමනාකරණය කිරීම මෙම අංශය මගින් සිදු වේ. ඒ අනුව බදවා ගැනීම්, උසස්වීම්, ස්ථාන මාරුකිරීම්, සේවක ආරවුල් විසඳීම්, කම්කරු ආරවුල් සඳහා පෙනී සිටීම, සේවක අභියාචනාවන්ට ප්‍රතිචාර දැක්වීම යනාදී කාරණාවන් බොහොමයක් සඳහා පෙනී සිටී.

2020 වර්ෂය තුළ මානව සම්පත් අංශයේ තුල සිදු වූ වෙනස්කම්

1.1 2020.01.01 සිට 2020.12.31 දින දක්වා කාර්ය මණ්ඩල විස්තර පහත සඳහන් වේ

අනු අංකය	සේවා මට්ටම	අනුමත		භෞතික සේවක සංඛ්‍යාව 2020.12.31 දිනට			
		ස්ථිර	පෞද්ගලික වනසේ	ස්ථිර	කොන්ත්‍රාත්	දෛනික	සේවා ගිවිසුම්
01	ජ්‍යෙෂ්ඨ	206	2	97	-	-	-
02	තෘතිය	252	101	343	-	-	-
03	ද්විතීය	893	387	978	-	-	-
04	ප්‍රාථමික	219	104	230	-	-	-
එකතුව		**1570**	**594**	**1648**	**269**	**31**	**03**

1.2 2020.01.01 සිට 2020.12.31 දින දක්වා කාලය තුල පහත සඳහන් පරිදි බඳවා ගැනීම් සිදුකර ඇත.

සෘජු බඳවා ගැනීම්				නැවත සේවය බඳවා ගැනීම් විශ්‍රාම ගැන්වීමෙන් පසු	එකතුව
ස්ථිර		කොන්ත්‍රාත්	දෛනික	කොන්ත්‍රාත්	
විධායක	විධායක නොවන				
-	-	-	03	01	04

1.3 ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සේවකයින් සඳහා 2020.01.01 සිට 2020.12.31 දින දක්වා කාලය තුළ අභ්‍යන්තර උසස්වීම් උසස් වීම් ලබා දී නොමැත.

1.4 2020.01.01 සිට 2020.12.31 දින දක්වා කාලය තුල විශ්‍රාම ගැන්වීම්, සේවය අවසන් වීම්, ධුරය අතහැර යෑම් හා ඉල්ලා අස්වූ සේවක සංඛ්‍යාව පහත සඳහන් පරිදි වේ.

අනු අංකය	සේවා මට්ටම	විශ්‍රාම ගැන්වීම	සේවය අවසන්	ඉල්ලා අස්වීම්	ධුරය අතහැර යෑම්
01	ජ්‍යෙෂ්ඨ	04	02	02	01
02	තෘතිය	39	278	06	01
03	ද්විතීය	14	146	15	05
04	ප්‍රාථමික	18	1910	04	16
එකතුව		**75**	**2336**	**27**	**23**

1.5 මෙම අධිකාරියේ සේවයේ නියුතුව සිටිය දී 2020.01.01 සිට 2020.12.31 දින දක්වා මරණයට පත් වූ සංඛ්‍යාව 01 කි.

1.6 මානව සම්පත් කළමනාකරණ අංශයේ සාමාන්‍ය කාර්යභාරය පහත පරිදි වේ.

- ප්‍රධාන කාර්යාලය හා දිස්ත්‍රික් කාර්යාල සඳහා සේවක අවශ්‍යතා / පුරප්පාඩු හඳුනා ගැනීම, ඒ අනුව වාර්ෂික මිනිස්බල අයවැය සකස් කිරීම සහ අධ්‍යක්ෂ මණ්ඩලයට හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට යොමු කර අනුමැතිය ලබා ගැනීම හා කාර්ය මණ්ඩලය යාවත්කාලීන කිරීම.
- බඳවා ගැනීම් පරිපාටිය සකස් කිරීම සහ අධ්‍යක්ෂ මණ්ඩලයට හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට යොමු කර අනුමැතිය ලබා ගැනීම.
- පුරප්පාඩු පිරවීම සඳහා අදාල අනුමැතීන් ලබා ගැනීම, අයදුම්පත් කැඳවීම සඳහා විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය දැන්වීම් පළ කිරීම, සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම, සුදුස්සන් හඳුනා ගැනීම, පත්වීම් ලබාදීම සහ පුරප්පාඩු සඳහා අනුයුක්ත කිරීම.
- මෙම අධිකාරියේ ස්ථිර, කොන්ත්‍රාත්, දෛනික පුද්ගලික ලිපිගොනු පවත්වා ගෙන යාම. (මුල් පත්වීම් දින සිට සේවය අවසන් වන දින දක්වා වූ රාජකාරී)
- අභ්‍යන්තර උසස්වීම් සඳහා අයදුම්පත් කැඳවීම, සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම, සුදුස්සන් හඳුනා ගැනීම, උසස්වීම් ලබාදීම සහ පුරප්පාඩු සඳහා අනුයුක්ත කිරීම.
- වාර්ෂික ස්ථාන මාරුවීම් සඳහා ස්ථාන මාරුවීම කමිටු පත් කිරීම හා ඒවායේ නිර්දේශ ලබා ගෙන ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම / විශේෂ හේතු මත ස්ථාන මාරුවීම් සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීම.
- විධායක ශ්‍රේණියේ නිළධාරීන්ගෙන් වාර්ෂිකව වත්කම් බැරකම් ප්‍රකාශ ලබා ගැනීම හා ඒ සම්බන්ධ ලේඛන පවත්වාගෙන යාම හා සහනදායී පදනම මත මෝටර් රථ බලපත්‍ර ලබාදීම සම්බන්ධ කටයුතු.
- කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරනු ලබන චක්‍රලේඛ ප්‍රකාරව වැටුප් සංශෝධන ක්‍රියාත්මක කිරීම සම්බන්ධ සියළු රාජකාරී.
- පරිපාලන රාමුව තුළ විසඳුම් ලබා දිය හැකි සේවක දුක් ගැනවිලි විසඳීම සඳහා ඉදිරි කටයුතු සිදු කිරීම.
- අධිකාරියේ ස්ථාපනය කර ඇති සේවක අභියාචනා කමිටුව වෙත සේවක දුක් ගැනවිලි (ඉහල කළමනාකාරීත්වයේ නිර්දේශ සහිතව ලැබෙන) යොමු කිරීම, එම දුක්ගැනවිලි විසඳීමට අදාළ නිර්දේශ ඉදිරිපත් කිරීම, සේවක අභියාචනා කමිටුවේ නිර්දේශ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම හා අධ්‍යක්ෂ මණ්ඩල තීරණ ක්‍රියාත්මක කිරීම.
- කාර්මික ආරවුල් (මානව හිමිකම් / කම්කරු කොමසාරිස්/ කම්කරු විනිශ්චය සභා/ පාර්ලිමේන්තු උපදේශක කාරක සභා/ කම්කරු අධිකරණ) පිළිබඳ කටයුතු.
- සේවකයින්ගේ විශ්‍රාම ගැන්වීම්, ඉල්ලා අස්වීම්, වාර්ෂික වැටුප් වර්ධක ගෙවීම් හා ඒ සම්බන්ධ කැඳවීම, සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම, සුදුස්සන් හඳුනා ගැනීම, පත්වීම් ලබාදීම.
- සේවය අවසන් කල සේවකයින් හට හිමි සේවක අර්ථ සාධක අරමුදල්/ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල්/පාරිතෝෂික දීමනා ගෙවීම් පිළිබඳ කටයුතු කිරීම හා සේවකයින්ගෙන් අධිකාරිය වෙත අයවීමට ඇති මුදල් අයකර ගැනීමේ කටයුතු.
- චක්‍රලේඛ ප්‍රකාරව වගකිව යුතු තනතුරු දරණ නිලධාරීන්/ සේවකයන් (ආරක්ෂක, මුදල් අයකැමි වැනි) විසින් තැන්පත් කල යුතු ඇප තැන්පතු අයකර ගැනීම හා ඔවුන් විශ්‍රාම යාම/ ඉල්ලා අස්වීමත් සමග එම ඇප තැන්පතු නිදහස් කිරීම.
- මානව සම්පත් කළමනාකරණ විෂය පථයට අදාලව අදාළ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා සකස් කර යොමු කිරීම.
- ගරු ඇමතිතුමා/ රේඛීය අමාත්‍යාංශය/ අමාත්‍ය කාර්යාලයට හා ඉහළ කළමනාකාරීත්වය වෙත ලැබෙන සේවක ඉල්ලීම් සඳහා විසඳුම් ලබාදීම/ පිළිතුරු ලබාදීම.
- මානව සම්පත් කළමනාකරණ විෂය පථයට අදාලව රජයේ විගණන විමසුම් හා අභ්‍යන්තර විගණන විමසුම් සඳහා පිළිතුරු ලබාදීම.

- රේඛීය අමාත්‍යාංශයේ පැවැත්වෙන ගරු අමාත්‍ය තුමාගේ හා ආයතන ප්‍රධානීන්ගේ ප්‍රගති සමාලෝචන රැස්වීම්, කළමනාකරණ කමිටු රැස්වීම, විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වැනි වෙනත් විවිධ අභ්‍යන්තර රැස්වීම් නියෝජනය.
- මානව සම්පත් කළමනාකරණ විෂය පථයට අදාලව පොදු ව්‍යාපාර කාරක සභාව, ජනාධිපති විමර්ෂන කොමිෂන් සභාව, මූල්‍ය අපරාධ විමර්ෂන කොට්ඨාශය, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව සඳහා අදාළ තොරතුරු ලබා දීම හා නියෝජනය.
- ශ්‍රී ලංකා මහ බැංකුව වෙත කාර්තුමය වශයෙන් ඉදිරිපත් කල යුතු වාර්තා හා ලිපි සකස් කිරීමේ කටයුතු හා රේඛීය අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කළ යුතු මාසික හා කාර්තුමය වාර්තා සකස් කිරීම.

1.7 වර්ෂය තුල ඉටු කරන ලද කාර්යයන්.

I. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් අනුමත 2018 මිනිස්බල ඇස්තමේන්තුවට අදාලව සකස්කරනු ලැබූ බඳවා ගැනීම් පරිපාටිය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අනුමැතිය ලබාගැනිමට කටයුතු කිරිම.

II. ස්ථානමාරු කමිටු නිර්දේශ පරිදි සේවක ස්ථාන මාරු 52 ක් ක්‍රියාත්මක කර සේවක සහන සලසාදීම.

III. කළමනාකරණ සේවා චක්‍රලේඛ 02/2016 අනුව 2020 වසරට අදාලව ස්ථිර සේවකයින් 1715 ක වැටුප් ගැලපිම කර ලබාදිම.

IV. ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ පුරප්පාඩු පවතින තනතුරු අතුරින් HM වැටුප් බෑණ්ඩයට අදාලව තනතුරු 16 ක පුරප්පාඩු සම්පූර්ණ කිරිමට 2020.10.04 දින බාහිර හා අභ්‍යන්තර අයදුම්පත් කැඳවමින් පුවත්පත් වල දැන්වීමක් පළකර පුරප්පාඩු සම්පූර්ණ කිරිමට අදාල මූලික කටයුතු සිදු කර ඇත.

1.8 මානව සම්පත් කළමනාකරණයට අදාල කාර්යයන් ඉටුකිරීමේදී මෙම අංශයට මුහුණ දීමට සිදුවූ අභියෝග පහත පරිදි වේ.

i. 2020 වර්ෂය තුල පැවති Covid 19 වසංගත තත්වය හේතුවෙන් දුරස්ථ ක්‍රමවේදය ඔස්සේ සමස්ථ මානව සම්පත උපයෝජනය කිරීමට සිදුවිය.

ii. කාර්ය මණ්ඩලය තුල පවතින පරිගණක දැණුම අඩුකම හා නව තාක්ෂණික ක්‍රම භාවිතය පිළිබඳ පළපුරුද්ද අඩුවීම හේතුවෙන් අරමුණු කරා ලගාවීමේදී ගැටළුකාරී තත්වයන්ට මුහුණ දීමට සිදුවිය.

iii. මානව සම්පත පිළිබඳ නිවැරදි තොරතුරු නියමිත වේලාවට ලබාගත හැකිවන පරිදි ක්‍රමවේද වැඩිදියුණු වී නොතිබීම.

iv. මානව සම්පත් කළමනාකරණ විෂය ක්ෂේත්‍රයට අදාල කාර්යයන් විවිධ හේතූන් මත නියමිත ක්‍රමවේද ඔස්සේ ක්‍රියාත්මක නොවීම තුල සේවක ගැටළු මතුවීම හා ඒ තුළින් සේවක තෘප්තිය හීනවීම හා කම්කරු ආරවුල් සඳහා වැඩි නැඹුරුතාවයක් දැක්වීම.

1.9 මානව සම්පත් කළමනාකරණයට අදාල කාර්යයන් ප්‍රශස්ථව ඉටුකරමින් සමස්ථ ආයතනික අරමුණු ලගාකර ගැනීමේදී මෙම අංශයට මුහුණ දීමට සිදුවන අභියෝග වලට මුහුණ දීම සඳහා ක්‍රියාත්මක කලයුතු යෝජනා පහත පරිදි වේ.

i. මානව සම්පත් කළමනාකරණ විෂයට අදාල තීරණ ගැනීමේදී පවතින චක්‍රලේඛ , විධිවිධාන හා නීතිරීති වලින් බැහැරව කටයුතු කිරීම තුළින් ප්‍රායෝගික ගැටළු මතු වී ඇති බැවින් නියමිත ක්‍රමවේදයන් තුල පිහිටා තීරණ ගැනීම සඳහා අවධානය යොමු කිරීම.

ii. සේවක තෘප්තිය වැඩිදියුණු වන ආකාරයෙන් මානව සම්පත උපයෝජනය කරගැනීම.

iii. සේවක දුක්ගැනිවිලි සම්බන්ධයෙන් නිරන්තරයෙන් විමසා බලමින් ඒ සඳහා විසඳුම් ඉදිරිපත් කිරීම.

iv. නිරන්තරයෙන් සේවක පුහුණු වැඩසටහන් හා කුසලතා වර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරමින් සේවක ඵලදායිතාවය වැඩිදියුණු කරගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම හා සේවකයන් තුල තොරතුරු තාක්ෂණය පිළිබඳ වැඩිදියුණු කිරීමට අදාල පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ අවධානය යොමු කිරීම. තවද ආයතන සංස්කෘතියට ගැලපෙන ආකාරයෙන් සේවක ආකල්ප වෙනස් කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.

02 පාලන අංශය.

ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය හෝ ආයතන ප්‍රධානීන් විසින් ගනු ලබන තීරණ පිළබඳව ප්‍රධාන කාර්යාලය, දිස්ත්‍රික් කාර්යාල, නගර කාර්යාල හා උප කාර්යාල වෙත චක්‍රලේඛ/කාර්යාල නියෝග මගින් දැනුවත් කිරීම ඇතුළු පහත සඳහන් රාජකාරී මෙම අංශයේ රාජකාරී පථයට ගැනේ

2.1 පාලන අංශය යටතේ ක්‍රියාත්මක සේවාවන්.

(a) දෛනික පැමිණීම් පිටවීම් වාර්තා පවත්වා ගැනීම හා ඒ තුලින් නිවාඩු ගැලපීම, ප්‍රසාද දීමනා, දිරි දීමනා, විවේක නිවාඩු, අතිකාල, නිවාඩු දින දීමනා ආදිය ගෙවීම් කිරීම සඳහා අවශ්‍ය කටයුතු සැළසීම.

(b) වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය යටතේ සාමාන්‍ය, නේවාසික ප්‍රතිකාර, නේවාසික පරීක්ෂණ, බරපතල සැත්කම් සඳහා වන වෛද්‍ය බිල්පත් ප්‍රතිපූර්ණය කිරීම

(c) දෛනික එන සහ යන තැපැල් මෙහෙයුම් කටයුතු කිරීම.

(d) සේවක ආපදා ණය නිකුත් කිරීමට අදාල මූලික කටයුතු සිදුකර අදාල අනුමැතීන් සමඟ ගෙවීමට යොමු කිරීම.

(e) කාර්යාල ගොඩනැගිලි රක්ෂණය

(f) ගමන් වියදම්, යතුරුපැදි සැතපුම් කුළී දීමනා , නිවාස කුළී දීමනා, දිස්ත්‍රික් කාර්යාල ගොඩනැගිලි කුලී ගෙවීම සඳහා මූලික කටයුතු සිදුකිරීම හා අදාල අනුමැතිය සමඟ ගෙවීම් කටයුතු සඳහා ඉදිරිපත් කිරීම.

(g) ප්‍රධාන කාර්යාලයේ කාර්යමණ්ඩලය සඳහා තේ සළාක ද්‍රව්‍ය නිකුත් කිරීම සඳහා අනුමැතීන් ලබා දීම.

(h) සෘජු දුරකථන බිල්පත් පියවීම, සෘජු දුරකථන හා අභ්‍යන්තර දුරකථන ජාලයේ නඩත්තු කටයුතු සම්බන්ධීකරණය.

(i) ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සහ ජාතික නිවාස දෙපාර්තමේන්තුවේ ලේඛණාගර පවත්වාගෙන යාම.

(j) විදුලි සෝපාන වල මෙහෙයුම් රාජකාරී

(k) බාහිරින් පැමිණෙන අමුත්තන් සහ සේවා ලාභීන් පිළිගැනීම හා අදාල අංශ වෙත යොමු කිරීම

(l) පොත් බැඳීම් කටයුතු.

2.2 මෙම අංශය තුල පහත සඳහන් අයුරින් සේවකයින් අනුයුක්තව සේවය කරනු ලබයි.

අනු අංකය	තනතුර	සේවා කාණ්ඩය	සේවක සංඛ්‍යාව
01	කළමනාකරු	MM 1-1 - I	01
02	පරිපාලන නිළධාරී	JM 1-1 - II	04
03	පිළිගැනීමේ නිළධාරී	JM 1-1 - II	01
04	ල.ය.ලේ./පුද්ගලික සහකාර	JM 1-1 - II	01
05	කළමනාකරණ සහකාර කළමනාකරණ සහකාර - 01 පරිගණක ක්‍රියාකරු - 01	MA 1-2 - I	02
	කළමනාකරණ සහකාර - 03 දුරකථන ක්‍රියාකරු - 01 ඡායා පිටපත් යන්ත්‍ර ක්‍රියාකරු - 01	MA 1-2 - III	05
06	ලේඛණාගාර භාරකරු	PL 1 - I	01
07	විදුලි සෝපාන ක්‍රියාකරු	PL 1 - I	02
08	කාර්යාල සහකාර - 03 ලේඛණාගාර භාරකරු - 01 විදුලි සෝපාන ක්‍රියාකරු - 01 (පහත සඳහන් තනතුරු වල රාජකාරී ආවරණය කරනු ලැබේ) කළමනාකරණ සහකාර - 01 විදුලි සෝපානය ක්‍රියාකරු - 01 ලේඛණ භාරකරු - 01 දුරකථන ක්‍රියාකරු - 01	PL 1 - I PL 1 - II PL 1 - III	09
එකතුව			26

2.3 2020 වර්ෂයේ ප්‍රසාද දීමනා සේවකයින් වෙත ලබා දී ඇති අතර ආපදා ණය, යැපීම් දීමනා සංයුක්ත දීමනා ගෙවීම සඳහා අනුමැතිය ලබාදීම හා දිස්ත්‍රික් කාර්යාලවල කුලී දීමනා ගෙවීම් කටයුතු අනුමත කිරීමේ කටයුතු සිදුකර ඇත.

ආපදා ණය ඉල්ලුම් කර ඇති සේවකයන් ගණන	ආපදා ණය ගෙවූ මුදල රුපියල්
82	205,500,000.00

2.4 ප්‍රධාන කාර්යාලයේ වැටුප් ලබන වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ සාමාජිකයින්ට පහත සඳහන් ආකාරයෙන් 2020 වර්ෂය සඳහා ගෙවීම් කර ඇති

අනු අංකය	ප්‍රතිලාභ පිළිබඳ තොරතුරු	ප්‍රතිලාභ ලද සාමාජික ගණන	මුදල (රු)
01	බාහිර ප්‍රතිකාර	386	5,094,369.00
02	නේවාසික ප්‍රතිකාර පරීක්ෂණ හා වෛද්‍ය ගාස්තු	16	394,809.00
03	නේවාසික ප්‍රතිකාර ශල්‍යකර්ම හා වෛද්‍ය සේවා ගාස්තු	09	454,592.00
04	බරපතල සැත්කම් හා අඛණ්ඩ ප්‍රතිකාර	10	2,004,693.00
05	රජයේ රෝහල් සඳහා නේවාසික ප්‍රතිකාර	12	28,800.00
06	බෝවන හා වසංගත රෝග	01	5,600.00
07	කා.නි. 2016/04 හි 08 ඡේදය අනුව ප්‍රතිලාභ	04	7,800.00
එකතුව		**438**	**7,990,663.00**

2.5 2020.01.01 දින සිට 2020.12.31 දින දක්වා වියදම්.

01	කාර්යාලීය දුරකථන	2.447,760.00
02	තැපැල් වියදම	404,450.00
03	සීඝ්‍රගාමී තැපැල් සුළු මුදල් (Petty Cash)	14,580.00
04	ප්‍රධාන කාර්යාල රක්ෂණ ආවරණය	1,300,926,789.25
05	මාතලේ දිස්. කාර්යාල ගෙවල් කුළී (125,000/- X 12)	1,500,000.00
06	මහනුවර දිස්ත්‍රික් කාර්යාලයේ රක්ෂණය	92,685.48
07	තේ සලාකය (සිනි කිලෝ) 431 X 12 = 5172 X රු: 125/- (තේ කොළ ග්‍රෑම් 100) 431 X 12 = 5172 X රු: 104/-	 646,500.00 537,888.00
08	2020 වර්ෂයට පුවත්පත් මිලදී ගැනීම සඳහා වියදම	312,210.00
09	සුළු මුදල් අග්‍රමය මඟින් 2020 වර්ෂය තුලදී මිලදී ගැනීම වෙනුවෙන් වැයවූ මුදල	6,230.00
10	දුෂ්කර සේවා ගෙවල් කුළී දීමනාව ලබා දී ඇත දිස්ත්‍රික් කාර්යාල සඳහා යතුරු පැදි දීමනා ලබා දී ඇත	
එකතුව		**1,306,889,092.73**

03. මාණ්ඩලික නිවාස ණය අංශය.

වැටුප් බාණ්ඩ පරාසය	ප්‍රධාන කාර්යාලය		දිස්ත්‍රික් කාර්යාල		ගෙවා ඇති මුළු මුදල රුපියල්
	සේවක සංඛ්‍යාව	මුදල (රු)	සේවක සංඛ්‍යාව	මුදල (රු)	
HM 2-1-MA 5-2	02	2,360,500.00	03	3,305,000.00	5,665,500.00
MA 2-2 MA 1-2	02	2,685,624.10	04	5,300,000.00	7,985,624.10
PL1-PL3	01	1,141,200.00	-	-	
එකතුව	**05**	**6,187,324.10**	**07**	**8,605,000.00**	**14,792,324.10**

3.1 ඉලක්ක සපුරා ගැනීමට ගත් ක්‍රියාමාර්ග.

මෙම ආයතනයේ අයහපත් මුල්‍ය තත්වය මත 2019 වර්ෂයේ අගෝස්තු මස සිට මාණ්ඩලික නිවාස ණය ගෙවීම තාවකාලිකව නතර කිරීමෙන් පසු 2020 වර්ෂයේ මාර්තු මස වන තෙක්ම නැවත ගෙවීම් කිරීමට තිරණ ලබානොදුන් බැවින් කළමනාකරණ කමිටුවට හා අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා මගින් කරුණු ඉදිරිපත් කර නැවත ණය අයදුම්පත් නිකුත් කිරීමට හා 2019 වර්ෂයේ ණය අනුමැතිය ලබාදී ගෙවීම නතර කර තිබූ ණය වාරික ගෙවීම් කිරීමට අනුමැතිය ලබා ගැනිම.

කොවිඩ් වසංගත රෝගය ව්‍යාප්ත වීම හේතුවෙන් අඛණ්ඩව සේවයට වාර්තා කිරීමට නොහැකි වුවද දිස්ත්‍රික් කාර්යාල වලින් එවනු ලැබූ අඩුපාඩු සහිත වූ ණය ලිපිගොනු පරීක්ෂා කර අදාල දිස්ත්‍රික් කාර්යාල වල විෂයභාර නිලධාරීන් දැනුවත් කර එම අඩුපාඩු සම්පූර්ණ කරවා ප්‍රමාදයකින් තොරව අනුමතියට යොමු කිරීමට කටයුතු කිරීම.

3.2 ඉලක්ක කරා ළඟාවීමේදී මුහුණ පෑමට සිදුවූ ගැටළු.

2020 වර්ෂයේ මුල් කාලසීමාව තුල මණ්ඩලික නිවාස ණය ගෙවීම තාවකාලිකව නතර කර තිබීම හා කොවිඩ් වසංගත රෝගය ව්‍යාප්තවීම හේතුවෙන් ආයතනයේ පැවති අයහපත් මුල්‍ය තත්වය මත 2020 වර්ෂයේ මණ්ඩලික නිවාස ණය ලබාදීම පහත වැටීම.

මාණ්ඩලික නිවාස ණය අංශයට අදාල ලිපිගොනු /ලිපි වෙනත් අංශ වෙත යැවීමේ දී කාර්යාල සහායකවරයකු නොමැති වීම හේතුවෙන් විවිධ අපහසුතාවයන්ට පත්වීම.

04. පුහුණු හා සංවර්ධන අංශය.

උක්ත කරුණ සම්බන්ධයෙන් පුහුණු ඒකකයෙන් ක්‍රියාත්මක කිරීමට යෝජිත වැඩසටහන්වලට අදාළ ඇස්තමේන්තුව මේ සමඟ ඉදිරිපත් කරමි.

අපගේ දැක්ම

නිවාස සංවර්ධන ක්ෂෙත්‍රය ඇතුළු අනිකුත් අදාළ ක්ෂෙත්‍රයන් සඳහා දැනුමෙන් හා නිපුණතාවයෙන් පිරිපුන් නිලධාරීන්/සේවකයින් පිරිසක් ඇති කිරීම.

අපගේ මෙහෙවර

ජාතික සංවර්ධනයට මඟ පෙන්වන්නා වූ ආයතනයේ දැක්ම පදනම් කරගත් සංවර්ධන ඉලක්කයන් පහසුවෙන් ජය ගැනීමට හැකි වන පරිදි ආයතනයේ නිලධාරීන්/ සේවකයින්ගේ දැනුම, ආකල්ප, නිපුණතාවය යනාදිය වැඩිදියුණු කර ගැනීම සඳහා අවශ්‍ය පහසුකම් සලසා දීම

ජාතික නිවාස සංවර්ධන අධිකාරියෙහි සියළුම කාර්ය මණ්ඩලය උදෙසා පුහුණු හා සංවර්ධන අවශ්‍යතා හඳුනාගෙන ආයතනික කාර්ය සාධනය ඉහළ මට්ටමක පවත්වා ගෙන යාමට කාර්ය මණ්ඩලයේ දැනුම, කුසලතා සහ ධනාත්මක ආකල්ප වර්ධනය කෙරේ.

එබැවින් ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ ප්‍රධාන කාර්යාල හා දිස්ත්‍රික් කාර්යාලයන්හි අනුයුක්ත කර ඇති සියලු කාර්යය මණ්ඩලය ඉලක්ක කර ගනිමින් ඔවුනට අවශ්‍ය වන පුහුණු අවශ්‍යතා හඳුනාගෙන විශ්ලේෂණය කිරීම හරහා ආයතනික කාර්යය සාධනය ඉහළට ගෙන යාම, පුහුණු හා සංවර්ධන අංශය මේ තුලින් අපේක්ෂා කෙරේ.

ඉලක්කය					
වර්ෂය	වැඩසටහන් සංඛ්‍යාව	සහභාගී වන නිළධාරීන්/ සේවකයින්	ඇස්තමේන්තුගත අයවැය (රු.මිලියන)		
			පුහුණු හා ශිෂ්‍යත්ව	පුහුණු ණය	එකතුව
2022	76	2600	8.500	4.500	13.000

අරමුණ	උපාය මාර්ගය	ක්‍රියාකාරකම/ කාර්යය
1. ඵලදායිතාවය ඉහල නැංවීම.	1. කණ්ඩායම් ක්‍රියාකාරකම්.	1. වැඩමුළු, සම්මන්ත්‍රණ, පුහුණු වැඩසටහන් පැවැත්වීම.
2. කාර්යක්ෂමතාවය ඉහල නැංවීම.	2. නව තාක්ෂණය උපයෝගී කිරීම.	
3. අරමුණු ඉෂ්ඨ කිරීම.	3. නිළධාරීන්ගේ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම සඳහා බාහිර ආයතන විසින් සංවිධානය කරනු ලබන පාඨමාලා වලට සේවකයින් ඇතුළත් කිරීම.	2. අධිකාරියේ කාර්යයන් සහ රාජකාරියෙහි ක්‍රියාකාරිත්වය සඳහා අවශ්‍ය පර්යේෂණ සහ සමාලෝචන පැවැත්වීම.
4. නායකත්ව පුහුණුව ලබා දීම.		
5. උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම.		
6. තාක්ෂණික කටයුතු වැඩිදියුණු කිරීම.	4. බාහිර සම්පත් මගින් පුහුණු කිරීම සඳහා අධික පිරිවැයක් දැරීමට සිදුවන බැවින් ඒ සඳහා ආයතනයේම නිළධාරීන් පුහුණු කිරීම.	3. Zoom තාක්ෂණය
7. නිර්මාණශීලීත්වය හා නවෝත්පාදනය.		
8. ආකල්ප සංවර්ධනය.		
9. ප්‍රාථමික ගණයේ සිට කළමණාකරන ශ්‍රේණි දක්වා කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත් වීම.	5. විවිධ ආයතන වලින් සම්පත් දායකයින් සම්බන්ධීකරණය.	
10. නව්‍යකරණය		
11. විදේශීය පුහුණු ලබාදීම.		

4.1 පුහුණු වැඩ සටහන් වර්ගීකරණය

4.1.1. අභ්‍යන්තර පුහුණු වැඩ සටහන්
4.1.2. බාහිර පුහුණු වැඩ සටහන් (දේශීය) - 90%
4.1.3. බාහිර පුහුණු වැඩ සටහන් (විදේශීය)
4.1.4. ස්වාභිමත පුහුණු ණය ක්‍රමය

4.1.1. අභ්‍යන්තර පුහුණු වැඩ සටහන

- කාර්යාල අවශ්‍යතාවය මත ඵලදායීතාවය වැඩි කිරීම සඳහා ඉහත වැඩ සටහන පුහුණු අංශය මගින් සංවිධානය කර ඇත. ඒ සඳහා සියළු වියදම් පුහුණු අයවැයෙන් දරනු ලැබේ.

- සහභාගීවන්නන්ගෙන් කිසිදු මුදලක් අය කරනු නොලැබේ.

- මෙයට සහභාගී වන නිලධාරීන් සඳහා අතිකාල දීමනා ගෙවනු නොලැබේ.

4.1.2. බාහිර පුහුණු(දේශීය) වැඩසටහන - 90%

අධිකාරිය මගින් අයදුම්පත් කැඳවනු ලබන පුහුණු පාඨමාලාවන් /සම්මන්ත්‍රණ/වැඩමුළු සඳහා තෝරා ගනු ලබන අයදුම්කරුවන් පාඨමාලා ගාස්තුවෙන් 10% ක් දැරිය යුතු අතර ඉතිරි 90% අධිකාරිය විසින් දරනු ලැබේ. පුහුණුවීමට අවශ්‍ය කාලය සඳහා රාජකාරි නිවාඩු ලබා දෙන අතර, ගමන් වියදම් හා යැපීම් දීමනා ගෙවනු නොලැබේ.

4.1.3. බාහිර පුහුණු වැඩසටහන(විදේශීය)

පුහුණු ඒකකය මගින් විදේශ ශිෂ්‍යත්ව සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. අදාළ අයදුම්පත් සම්පූර්ණ කොට සාමාන්‍යාධිකාරීගේ නිර්දේශය මත අමාත්‍යාංශය මගින් විදේශ සම්පත් දෙපාර්තමේන්තුවට යොමු කරනු ලැබේ.

4.1.4. ස්වාභිමත පුහුණු ණය වැඩසටහන

- මානව සම්පත් සංවර්ධන අරමුණු කොට ගෙන සමස්ත කාර්ය මණ්ඩලයේ අභිවෘද්ධිය පිණිස ක්‍රියාත්මක කර ඇති මෙම වැඩ සටහන යටතේ ස්වකීය අභිමතය පරිදි රජය පිළිගත් පුහුණු ආයතනයක තම විෂය ක්ෂෙත්‍රයට අදාළ පාඨමාලාවක් හැදෑරීම පිණිස රු.100,000/= උපරිමයකට යටත්ව පොලී රහිත ණය මුදලක් වශයෙන් පාඨමාලා ගාස්තුව ලබා ගත හැකිය.

- රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ 01/2003 අනුව වෛකල්පික විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 55 බැවින් මෙම ණය මුදල වයස අවුරුදු 55 වන විට ගෙවා නිම කල යුතුය.

- ණය මුදල ආපසු ගෙවීමේ උපරිම කාලය මාස 50 කි.

- ණය අයදුම්පත් නිර්දේශ කිරීම සභාපතිතුමා විසින් පත් කල කමිටුවක් මගින් සිදු කෙරෙන අතර, සාමාන්‍යාධිකාරීගේ අනුමැතියට යටත්ව ණය මුදල නිදහස් කරනු ලැබේ.

- පුහුණු ණය අයදුම්පත් සඳහා අනුමැතිය ලද පසු ණය ලබා ගන්නා විසින් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සමඟ සේවා ගිවිසුමකට එළැඹිය යුතුය.

- අදාළ පාඨමාලාව තම අභිමතයට අනුව හෝ වෙනත් පෞද්ගලික හේතුවක් මත සම්පූර්ණ නොකලහොත් හෝ අසමත් වුවහොත් ගෙවන ලද ණය මුදල 10% වාර්ෂික දඩ පොලියක් සහිතව ආපසු අයකර ගැනීමට කටයුතු කරනු ඇත.

- පාඨමාලාව සාර්ථක ලෙස හදාරා අවසන් කිරීමෙන් පසු අදාළ ආයතනය විසින් ලබා දෙන සහතිකයේ සත්‍ය පිටපතක් හා තමන් ලබා ගත් දැනුම පිළිබඳ සංක්ෂිප්ත වාර්තාවක් පිටපත් 02 කින් යුතුව නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී(මානව සම්පත් කළමනාකරණ හා පාලන) වෙත දින 14 ක් ඇතුලත එවිය යුතුය.

4.2 අධ්‍යයන නිවාඩු.

I. ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ කාර්යක්ෂමතාවය, අරමුණු හා පරමාර්ථයන් මුදුන්පත් කර ගැනීම සඳහා පාඨමාලා/පුහුණු වැඩසටහන් හා පරීක්ෂණයන් සඳහා ස්ථීර සේවකයින් හට අධ්‍යයන නිවාඩු ලබා දෙනු ඇත.

II. මෙම අධ්‍යයන නිවාඩු ලබා දෙන්නේ දැනට නිරත ක්ෂෙත්‍රය හා තම පුද්ගලික දියුණුවට අදාළ විය හැකි යයි හැගෙන කෙටි කාලීන පාඨමාලා හැදෑරීම සඳහාය. එහිදී අදාළ නිලධාරියා/සේවකයා වෙත පැවරී ඇති රාජකාරි කටයුතුවලට බාධාවක් නොවිය යුතුය.

III. පරීක්ෂණ පවත්නා කාල පරිච්ඡේදය තුල දින 10 ක උපරිමයකට යටත්ව අධිකාරියේ අභිමතය පරිදි වර්ෂයකට එක් වතාවක් පමණක් නිවාඩු ලබා ගැනීමට හිමිකම් ලැබේ. මෙම වර්ගයේ නිවාඩු සිය සේවා කාලය තුල ලබා ගත හැක්කේ තුන් වතාවක් පමණි.

IV. මෙසේ කරනු ලබන ඉල්ලීම් පුහුණු ඒකකය විසින් නිකුත් කොට ඇති අයදුම්පත් මගින් තම අංශ ප්‍රධානියාගේ නිර්දේශය සමඟ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී(මානව සම්පත් කළමනාකරණ හා පාලන) වෙත ඉදිරිපත් කල යුතුය.

V. අධ්‍යයන නිවාඩු අනුමත කරවා ගැනීමෙන් පසු සහභාගී වන පාඨමාලා/වැඩමුළු/පරීක්ෂණ අවසානයේ ලබා ගන්නා සහතිකයේ සත්‍ය පිටපතක් පුහුණු ඒකකය වෙත ලබා දිය යුතුය.

2020 ප්‍රගතිය (2020-01-01 - 2020-12-31)				
අනු අංකය	**වැඩ සටහන් විස්තරය**	**වැඩ සටහන් සංඛ්‍යාව**	**සහභාගී වූ සංඛ්‍යාව**	**වියදම් වූ මුදල (රු.)**
1	අභ්‍යන්තර පුහුණු වැඩ සටහන්	6	961	82,765.00
2	බාහිර පුහුණු වැඩ සටහන්(දේශීය)(90%)			-
3	බාහිර පුහුණු වැඩ සටහන්(විදේශ)	-	-	-
4	විදේශ සංචාර	-	-	-
5	ස්වාභිමත පුහුණු ණය වැඩ සටහන	3	3	280,000.00
මුළු එකතුව		**9**	**964**	**362,765.00**

2020.01.01 දින සිට 2020.12.31 දක්වා පවත්වන ලද අභ්‍යන්තර පුහුණු වැඩ සටහන්				
අනු අංකය	**වැඩ සටහන් විස්තරය**	**වැඩ සටහන් සංඛ්‍යාව**	**වැඩ සටහනට සහභාගී වූ සංඛ්‍යාව**	**වියදම් වූ මුදල (රු.)**
1	"ඔබට ගෙයක් රටට හෙටක් " නිවාස වැඩ සටහන මාළිගාවත්ත ප්‍රදීපා ශාලාව (නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි / සහකාර සාමාන්‍යාධිකාරි / ජ්‍යෙෂ්ඨ කළමනාකරු / දිස්ත්‍රික් කළමනාකරු හා තෝරාගත් දිස්ත්‍රික් කාර්යය මණ්ඩල	01	170	72,765.00
2	නායකත්ව පුහුණු වැඩ මුළුව ප්‍රධාන කාර්යාලය (සහකාර සාමාන්‍යාධිකාරි / ජ්‍යෙෂ්ඨ කළමනාකරු / කළමනාකරු හා පරිපාලන නිලධාරින්)	01	60	20,025.00
3	තාක්ෂණ නිලධාරින් දැනුවත් කිරීමේ වැඩමුළුව (දිස්ත්‍රික් කළමනාකරුවන්, තාක්ෂණ නිලධාරින්, තාක්ෂණ සහකාරවරුන් හා අයකිරීම් නියෝජිතයින්) මාළිගාවත්ත ප්‍රදීපා ශාලාව	01	562	230,650.00
4	" නීල හරිත ශ්‍රී ලංකාවක් " වැඩ සටහන (ඉංජිනේරු අංශය) ප්‍රදාන කාර්යාලය	01	32	10,000.00
5	දේපළ කළමනාකරණය පිළිබඳ වැඩ මුළුව (උපාධිධාරින්, පරිපාලන නිලධාරින් හා කළමනාකරණ සහකාරවරුන්)	01	70	43,758.00
6	දැනුවත් කිරීමේ වැඩ මුළුව - නවක බඳවාගත් පුහුනු උපාධිධාරින්	01	67	7,897.00
මුළු එකතුව		06	961	385,095.00

පුහුණු අංශය මඟින් 2020 සැළසුම් කරන ලද වැඩමුළු, සම්මන්ත්‍රණ හා පාඨමාලා ඒ වන විට රටේ පැවති කොවිඩ් - 19 වසංගත තත්ත්වය හේතුවෙන් ක්‍රියාවට නැංවීමට නොහැකි විය. තවද පුහුණු ඒකකයට අවශ්‍ය තාක්ෂණික පහසුකම් හා කාර්යය මණ්ඩල පහසුකම්ද අවම බව වැඩිදුරටත් දන්වා සිටිමි.

05. පුස්තකාලය.

නිවාස විෂය පථයට අදාල ආයතනික කටයුතු මෙසේ දැය වෙනුවෙන් ඉටුවෙද්දී, 1987 වසරේ අප අධිකාරිය තුල ද එහි නිළධාරීන් හා සේවකයන්ගේ ප්‍රයෝජනයට මෙන්ම විශ්ව විද්‍යාල සිසුන් හා ආචාර්යවරුන් , රජයේ හා පුද්ගලික ආයතන වල සේවකයන්ගේ ද ප්‍රයෝජනය උදෙසා නිවාස විෂයට අදාල විශේෂ පුස්තකාලයක් පිහිටුවන ලදි.

පුස්තකාල සේවාවක මූලික අරමුණ වන්නේ පාඨකයාගේ තොරතුරු අවශ්‍යතා සපුරා ගැනීම සඳහා ඔවුන් යොමු කිරීම වන අතර, වෙනත් අයුරකින් කිවහොත් තොරතුරු අවශ්‍යතාවයෙන් සිටින පාඨකයාට අදාල තොරතුරු ලබා දීම පුස්තකාලයක මූලික අරමුණයි.

පුස්තකාලයක වටිනාකම අපගේ පැරැන්නන් විසින් ද දැන සිටි අතර, මෙම පුස්තකාල ඉතිහාසය සමඟ ලේඛන මාධ්‍ය ඉතිහාසයත් එක හා සමානව ගමන් කරනු ලැබීය. ඒ අනුව සමාජයේ සෙසු ආයතන මෙන්ම "පුස්තකාලය" ද ඈත අතීතයේ සිටම කාර්ය භාර්යක් ඉටු කළ සමාජ සංස්ථාවක් වශයෙන් පෙන්වා දිය හැකිය.

එමෙන්ම මිනිසාගේ බුද්ධිමය ක්‍රියාකාරීත්වයේ ප්‍රතිඵලයක් ලෙස බිහිවන තොරතුරු ඔස්සේ අනාගත පරපුරට අවැසි දෑ ප්‍රයෝජනවත් අයුරින් ලබා ගැනීම, සකස් කර තිබීම, ගබඩා කිරීම, නිවැරදි තොරතුරු බෙදා හැරීම හා සන්නිවේදන කටයුතු ආදි සියලු දේ සඳහා පරිපූර්ණ ඒකකයක් වශයෙන් ද පුස්තකාලයක් හැඳින්විය හැක.

ඒ අනුව සමාජයේ සෙසු ආයතන තුල මෙන්ම අප අධිකාරිය සතු පුස්තකාලය තුලින් ද වර්තමානය වන විට ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය තුලින් ද පාඨකයාට අවැසි තොරතුරු ද කඩිනමින් සොයා ගැනීමේ හැකියාව ඇති අතර, මෙම පුස්තකාලය තුල නිවාසීකරණයට සම්බන්ධව විෂයන්ට අදාලව අන්තර්ගත කොට ඇති ප්‍රකාශන අතරෙහි නිවාස, ගොඩනැගිලි හා සම්බන්ධිත ඉදිකිරීම්, ඉංජිනේරු, ගෘහ නිර්මාණ, ප්‍රමාණ සමීක්ෂණ, ඉඩම් මෙන්ම ඒ යටතේ ඇති අනු විෂයන් සඳහා ද එකතුවක් ගොනු කොට ඇත.

එමෙන්ම තොරතුරු එක් රැස් කර ගැනීමේදි පොත-පතට පමණක් සීමා නොවි අවැසි විෂයන්ට සම්බන්ධ සඟරා, පුවත් පත් කැපුම් ද, අධිකාරියේ නිවාස යෝජනා පිළිබඳ ඵල වූ තොරතුරු මෙන් ම ඒවාට අමතරව නීති වාර්තා, රජයේ අණ-පනත් ආදි එකතුවකුත් ද මෙහි ගබඩා වී ඇත. තවද වැඩිදුර අධ්‍යාපනයක් ලබනා නිවාස අධිකාරියේ කාර්ය මණ්ඩලයට ද මෙම පුස්තකාලය තුලින් ඉමහත් සේවාවක් සිදුවන බව නම් නොරහසකි.

පුස්තකාලයෙහි ඇති තොරතුරු හා පොත පත නිවාස සංවර්ධන අධිකාරියේ සේවයේ නිරත ස්ථිර නිළධාරීන් හා සේවකයන් හට බැහැර ගෙනයාමට අවස්ථාව ලබාදෙන අතර, සෙසු පාඨකයින් හට ද සතියේ දින 05 තුල පුවත්පත් බැලීමට මෙන් ම සිය අවැසි පත-පොතට අයත් විමර්ශන කටයුතු සඳහා පුස්තකාලය විවෘතව පවතී.

මේ වන විටත් වටිනා ග්‍රන්ථ 7000 ක පමණ එකතුවකින් සමන්විත අප ජාතික නිවාස සංවර්ධන අධිකාරියට අයත් පුස්තකාලය, 2020-02-06 දින සිට ප්‍රධාන කාර්යාලයේ 09 වන මහලෙහි ස්ථාපිත කර ඇත.

භෞතික කාර්ය සාධනය.

(1) පවත්නා ග්‍රන්ථ කාර්ය මණ්ඩලයේ අවැසි අයවලුන් උදෙසා යලි ලබාදීමේ පදනම මත බැහැර ගෙනයාමට ලබාදීම.
සෙසු පාඨකයන්ට පුස්ථකාලයේ රැඳී සිටිමින් පුවත්පත් හා ඔවුනට අවැසි පත-පොත පරිශීලනයට අවස්ථාව ලබා දීම.

(2) සතියේ වැඩ කරන දින 05 තුල සිංහල හා ඉංග්‍රීසි මාධ්‍යයන් ලේක්හවුස් පුවත්පත් 02 ක් (දිණමින හා Daily News) පාඨක පරිහරණය උදෙසා ලබාදීමට කටයුතු කිරීම.

(3) වැ.බ. සාමාන්‍යාධිකාරි/නි.සා (මානව සම්පත් කළ. හා පාලන) ගේ වාචික උපදෙස් පරිදි කළමණාකරු (පුහුණු) ගේ රාජකාරි කටයුතු උදෙසා ද අවශ්‍ය අවස්ථාවලදී පරිසණක හා වෘත්තීමය වශයෙන් අවැසි වෙනත් සහායයන් ලබාදීමට කටයුතු කිරීම.

06. විනය අංශය

ආයතනික සේවා ඵලදායිතාවය හා කාර්යක්ෂමතාවය පවත්වා ගැනිම සඳහා මානව සම්පත විධිමත්ව කළමනාකරණය කරගත යුතුයි. විධිමත් අධ්‍යාපනික හැකියාවන්, දක්ෂතාවයන් සහිතවූ පිරිසක් මෙන්ම පහළ මට්ටමේ අධ්‍යාපනය සමත් ප්‍රවේශයක් සහිත පිරිසක් ද ආයතනය තුළ සිටීම සාමාන්‍ය තත්ත්වයකි. එහිදි රාජකාරිමය කටයුතු ඉටුකිරිමේදි ආයතනික නිතිරිති, රෙගුලාසි, වලට අවනත නිසා සිදුවන වැරදි මඟහරවා ගැනිම හා සිදුකරන වැරදි සඳහා දඩුවම් පැනවීම විනය අංශය මඟින් සිදුකරනු ලබයි.

යම් සේවකයකු ආයතනික මට්ටමින් නිතිරිති උල්ලංගනය වන පරිදි සිදුකරන වැරදි සුළු හා බරපතල වැරදි ලෙස ගැනෙන අතර, සිදු කරන ලද වැරදි ස්වභාවය අනුව විවිධ වූ දඩුවම් පැනවීම, අවවාද කිරීම, සේවයෙන්ඉවත් කිරීම, අනිවාර්ය නිවාඩු යැවීම ලෙස වර්ගිකරණය කර ආයතනයේ විනය ව්‍යවස්ථාව අනුව සේවකයින්ගේ හැසිරීම/ක්‍රියාකාරකම් පාලනය කිරීම හා ඊට අදාල අනපනත් ක්‍රියාත්මක කිරීම හා නිර්දේශ ඉදිරිපත් කිරීම විනය අංශය මඟින් සිදුකරනු ඇත.

07. ආරක්ෂක අංශය

ආයතනික භෞතික සම්පත් සොර සතුරන් ගෙන් ආරක්ෂා කරගැනීම, සිදුවිය හැකි අනතුරු වලින් ආරක්ෂා කිරීමත්, ආයතනික මානව සම්පතට එල්ලවන සොර සතුරු බලපෑම් වලින් ඔවුන් ආරක්ෂා කර ගැනීමත්, ආරක්ෂක අංශයෙහි ප්‍රධාන කාර්ය භාරයකි. ආයතනික ආරක්ෂක සේවාවන් සඳහා අභ්‍යන්තර කාර්ය මණ්ඩලයක් හා එහි කටයුතු කළමනාකාරිත්වය කිරීම සඳහා ආරක්ෂක කටයුතු මෙහෙයුම් කාර්යාලයක් ආයතනය තුල ස්ථාපිතව ඇත.

ආයතනික ආරක්ෂක සේවාව එහි කාර්ය මණ්ඩලය සිඝ්‍රයෙන් විශ්‍රාම යාම හේතුවෙන් සුළු පිරිසක් පමණක් මේ වන විට සේවයේ නියැලෙන අතර, වර්තමානය වනවිට ආයතනික නිළධාරීන් හා පුද්ගලික සේවා ආයතන මගින් කුළී පදනම මත ලබාගත් නිළධාරීන් සේවා අවශ්‍යතාවය පරිදි සේවයේ යොදවා ඇත.

ආරක්ෂක සේවාව මගින් ආයතනයේ ඇතුළත කාර්ය මණ්ඩලය හා මහජනතාව පරීක්ෂාවට ලක්කිරීම, ආයතනික රථ වාහන, බාහිර ආයතනික රථ වාහන පරීක්ෂාවට ලක්කිරීම, අදාල කාර්යයන් ප්‍රධාන සේවාවක් වනු ඇත.

08. ප්‍රවාහන අංශය

මානව සම්පත් කළමණාකරන හා පාලන කොට්ඨාශය සතු තවත් අංශයක් ලෙස ප්‍රවාහන අංශය හඳුනාගත හැකිය. විශේෂයෙන්ම අධිකාරියේ රාජකාරී කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රවාහන පහසුකම් සලසා දීම වාහන නඩත්තු කටයුතු හා වාහන අංගනය, වාහන ගරාජය නඩත්තුව මෙහි ප්‍රමුඛතම කාර්යය වේ. එම අංශය තුල පහත සඳහන් අයුරින් සේවකයින් අනුයුක්තව සේවය කරනු ලබයි.

ප්‍රවාහන අංශයේ කාර්ය මණ්ඩලය.

- අභ්‍යන්තර කාර්ය මණ්ඩලය - 08
- රියදුරු - 42
- රිය සහායක - 02

එකතුව - 52

8.1 ජාතික නිවස සංවර්ධන අධිකාරියේ රියදුරු තනතුරේ සේවයේ නියුතු සේවක තොරතුරු.

තනතුරේ ස්වභාවය	ප්‍රධාන කාර්යාලය	දිස්ත්‍රික් කාර්යාලය	එකතුව
ස්ථිර	15	33	52
දෛනික	04	01	05
කොන්ත්‍රාත්	21	14	35
මුළු එකතුව	**40**	**48**	**92**

8.2 ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ ප්‍රවාහන සංචිතයේ 2020.12.31 දිනට ඇති වාහන විස්තරය.

විස්තරය	කාර්	ජීප්	ඩබල් කැබ්	වෑන්	ලොරි	කෲ කැබ්	එකතුව
ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සතු වාහන	05	08	48	03	09	02	75
කම්කරු අමාත්‍යාංශයට අයත් වාහන	01	-	-	-	-	-	01
මෙහෙයුම් කල්බදු පදනමට ලබාගත් වාහන	-	03	15	-	-	-	18
මාසික කුලී පදනමට ලබාගත් වාහන	06	-	11	01	-	-	18
එකතුව	**12**	**11**	**74**	**04**	**09**	**02**	**112**

8.3 ප්‍රවාහන අංශය මගින් ක්‍රියාත්මක වැඩසටහන්.

a) මෙහෙයුම් කල් බදු ක්‍රමය යටතේ ලබාගත් ජීප් රථ 03 ක් ප්‍රධාන කාර්යාලයේ ඉහල කළමනාකාරිත්වයේ රාජකාරී සඳහා යොදවන ලද අතර කැබ් රථ 15 ක් සංවර්ධන කටයුතු සඳහා යෙදවීමේ අරමුණින් දිස්ත්‍රික් කාර්යාල සඳහා අනියුක්ත කර ඇත. මෙම වාහන සඳහා 2020 වර්ෂය තුල බදු කුලිය ලෙස රු.42,209,326/- ක් වැය කර ඇත.

b) 2020 වර්ෂය සඳහා වාහන අලුත්වැඩියා කිරීම වෙනුවෙන් රු. 3,665,897.22 ක් වැය කර වාහන 32 ක් අලුත්වැඩියා කර ධාවනයට එක් කර ඇත.

c) වාහන රක්ෂණය කිරීම සඳහා රක්ෂණ වාරික මුදල් ලෙස රු. 1,355,803.08 ක් වැය කර ඇති අතර 2020 වර්ෂය තුලදී රක්ෂණ වන්දි මුදල ලෙස රු.59,638.05 ක් ලබා ගෙන ඇත.

d) 2020 - 2021 වර්ෂය සඳහා ප්‍රවාහන සංචිතයේ ඇති යතුරු පැදිද ඇතුලු සියලුම වාහන බලපත්‍ර ලබා ගැනීම වෙනුවෙන් රුපියල් 513,890/- ක් වැය කර ඇත.

e) 2020 වර්ෂය සඳහා සංචිත වාහන වලට ඉන්ධන සැපයීම සඳහා අයවැය ප්‍රතිපාදන රු.මි.60.857 ක් වෙන් වී ඇති අතර 2020 වර්ෂයේදී රථ ධාවනයේ යොදවා ගැනීම වෙනුවෙන් ඉන්ධන සැපයීම සඳහා රු.7,567,587.61ක් වැය වී ඇත.

f) වාහන වාර සේවා කිරීමේදී දළ වශයෙන් ධාවන කි.මී.4000 කට පසුව වාර සේවාව සිදු කරනු ලබන අතර ප්‍රධාන කාර්යාලයේ රාජකාරියේ යොදවා ඇති වාහන පමණක් වාර සේවා කිරීම සඳහා 2020 වර්ෂයේදී රු.1,890,403.30 ක් වැය කර ඇත.

g) ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සංවර්ධන වැඩ සටහන් වර්ධනය වීම සහ ඉහල කළමනාකාරිත්ව තනතුරු සඳහා ප්‍රවාහන අවශ්‍යතා ඉහල යාමට අනුව ප්‍රවාහන සේවා සැපයීමට නොහැකි වීම නිසා 2020 වර්ෂය තුලද මාසික කුලී පදනම මත ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුගමනය කර වාහන කුලියට ගැනීමට සිදු විය. ඒ අනුව ප්‍රධාන කාර්යාලයේ පමණක් නිලධාරීන් 04 දෙනෙකුට ප්‍රවාහන පහසුකම් සැපයීමට හා වෙනත් විශේෂ කාර්යයන් සඳහා කුලී වාහන ලබාගෙන ඇති අතර ඒ සඳහා රු.7,300,018/- ක මුදලක් වැය කර ඇත.

h) ප්‍රවාහන අංශයේ වාහන අළුත්වැඩියා සහ අනෙකුත් නඩත්තු වියදම් සඳහා රු.75,000/= ක් බැගින් මාසික වාර දෙකකදී සුළු අක් මුදල් අග්‍රිමයක් පවත්වාගෙන යනු ලැබේ. 2020 වර්ෂයේදී සුළු අක් මුදල් ලෙස රු. 629,422/- ක් වියදම් කර ඇත. ප්‍රවාහන අංශයේ ගරාජය සඳහා රු. 5,000/- ක උපරිමයට යටත්ව අමතර කොටස් මිලදී ගැනීම හා සුළු අළුත්වැඩියා සිදු කිරීමත්, අධිවේගී මාර්ගයේ වාහන ගමන් කිරීම වෙනුවෙන් ලද බිල්පත් පියවීමත් අක් මුදලින් සිදු කර ඇත.

i) සුළු අළුත්වැඩියාවන් ප්‍රවාහන අංශයේ ගරාජයේ සිදු කිරීම මගින් අළුත්වැඩියා වියදම අවම කර ගැනීමට කටයුතු කර ඇත. ඒ යටතේ අංක 253-4115, 253-4218 හා PA-8057 දරණ රථවල එංජින් අලුත්වැවියාවන් සිදු කිරීම මගින් ආයතනයට විශාල මුදලක් ඉතිරි කර ඇත.

j) අළුත්වැඩියා හා නඩත්තු වියදම ඉහල යාම හා ඉන්ධන කාර්යක්ෂමතාව අඩුවීම නිසා ඉතා පාඩු සහගත පැරණි වාහන 16 ක් අපහරණය කිරීමට කටයුතු කර ඇත.

k) ප්‍රවාහන සංචිතය සතු වාහන ඉතා පැරණි වාහන බැවින් ප්‍රවාහන සේවා කාර්යක්ෂම කර ගැනීම හා කුලී වාහන ලබා ගැනීම අවම කර ගැනීම සඳහා අවම අවශ්‍යතාවය මත අළුතින් වාහන මිලදී ගැනීමට අවශ්‍ය කටයුතු කල ද අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය නොලැබීම හා අදාල චක්‍රලේඛන අවලංගු වීම නිසා රජයේ ප්‍රතිපත්තිමය තීරණ නිසා 2020 වර්ෂයේදීද අලුතින් වාහන මිලදී ගැනීමට නොහැකි විය.

l) එබැවින් ප්‍රවාහන සංචිතය සතුව පවතින වාහන ඉතා පැරණි වුවද, අළුතින් වාහන එකතු නොවීම නිසා පැරණි වාහන අපහරණය කිරීම ප්‍රමාද වී ඇති අතර අපහරණය සඳහා වෙන්කර තිබූ කැබ් රථ 02 ක්ද නැවත අලුත් වැඩියා කිරීමට කටයුතු කර ඇත.

m) සංචිතය සතුව පවතින වැඩි වාහන ප්‍රමාණයක් අවුරුදු 15,20 ඉක්මවා ඇති බැවින් ප්‍රවාහන සේවා සැපයීමේදී බොහෝ ගැටළු වලට මුහුණ දීමට සිදු වී ඇති අතර, ආයතනයේ සංවර්ධන කාර්යයන් වලට ද එය බලපා ඇත.

n) මෙම පැරණි වාහන රාජකාරී සඳහා යෙදවීමේදී ඉතා අකාර්යක්ෂම බැවින් දුර බැහැර රාජකාරී හා නිලධාරීන්ට ප්‍රවාහන සේවා සැපයීම සඳහා කුලී පදනමින් වාහන ලබා ගැනීමට කටයුතු කර ඇත.

8.4 ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සතු වාහන සංචිතය වයස් ප්‍රමාණය අනුව වර්ගීකරණය.

අනු අංකය	වාහන වර්ගය	05 ට අඩු	5 - 10	10 - 15	15 - 20	20 ට වැඩි	එකතුව
1	කාර් රථ	-	-	04	01	-	05
2	ජීප් රථ	-	-	-	-	08	08
3	වෑන් රථ	-	-	01	-	02	03
4	ඩබල් කැබ්	-	17	05	20	06	48
5	කෲ කැබ්	01	-	01	-	-	02
6	ලොරි	-	-	-	-	09	09
එකතුව		**01**	**17**	**11**	**21**	**25**	**75**

නීති කොට්ඨාශය

කාර්යයන් විග්‍රහය

ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ අරමුණු ඉටුකර ගැනීමේදී අනෙකුත් අංශ වලින් මෙන්ම නීති අංශයෙන් ද ඊට අවශ්‍ය සහයෝගය ලබාදීම සිදු කරනු ලබයි.

01. ඉඩම් හා නිවාස සඳහා සින්නක්කර ඔප්පු ලබාදීම.

02. තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත යටතේ ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ " නම් කළ නිලධාරි " තනතුරට අදාළ සියලු රාජකාරී කටයුතු සිදු කිරීම.

03. මහල් නිවාස වල ඔප්පු ලබාදීම සඳහා අවශ්‍ය වන සභාධිපත්‍ය ප්‍රකාශන සකස් කිරීම.

04. ජාතික නිවාස සංවර්ධන අධිකාරියට අදාළ දේපළ සම්බන්ධයෙන් පොදුවේ සමාජයට අගතියක් වන පැමිණිලි වලට අදාළව කටයුතු කිරීම.

05. අවශ්‍ය අවස්ථා වලදී යම් යම් පුද්ගලයන්ට හා ආයතන වලට එරෙහිව නීති කටයුතු කිරීම.

06. ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සතු ඉඩම් හා නිවාස අනවසරයෙන් භුක්ති විඳින අයට එරෙහිව නඩු පවරා නිරවුල් සන්තකය ලබා ගැනීම.

07. බාහිර පාර්ශවයන් හා මෙම අධිකාරිය අතර, කටයුතු වලදී කොන්ත්‍රාත් ගිවිසුම් සකස් කිරීම හා අනෙකුත් ගිවිසුම් සකස් කිරීම.

08. සියලුම දිස්ත්‍රික් කාර්යාල හා ප්‍රධාන කාර්යාලයේ සියළුම අංශ ආවරණය වන පරිදි අවශ්‍ය නීති උපදෙස් ලබාදීම.

09. ණය හා කුළී වාරික නොගෙවන, හිඟ ණය වාරික හිමියන්ට නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගනිමින් අධිකාරියට අයවිය යුතු මුදල් ලබා ගැනීමට කටයුතු කිරීම.

10. නීති නිවේදන හා නෙරපීමේ නියෝග නිකුත් කරමින් ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ අයකිරීම් සඳහා දායකත්වය ලබාදීම

11. මානව හිමිකම් පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කිරීම.

12. නීතිපති දෙපාර්තමේන්තුවට ගොනුකර ඇති නඩු සම්බන්ධයෙන් අවශ්‍ය සහාය ලබාදීම.

13. අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් ධුරයට අදාළ රාජකාරී කටයුතු සඳහා අවශ්‍ය නියෝජනය ලබාදීම.

14. ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ වෙනත් කමිටු සඳහා අවශ්‍ය නියෝජනය ලබාදීම. (උදා : විනය කමිටුව, අභියාචනා කමිටුව)

සින්නක්කර ඔප්පු නිකුත් කිරීම.

සම්පූර්ණ මුදල් ගෙවූ නිවාසලාභීන් වෙත සින්නක්කර ඔප්පු පිරිනැමීමේ කාර්යය ප්‍රධාන වශයෙන් සිදු කරනු ලබන කාර්යයකි. මෙහිදී සභාධිපත්‍ය නොවන දේපළ හා ඉඩම් සඳහා ද සින්නක්කර ඔප්පු ලබාදීම සිදුකරනු ලබයි.

2020 වර්ෂය සඳහා ඔප්පු නිකුත් කිරීමේ වාර්ෂික ඉලක්කය 3000 ක් වුවද ඔප්පු නිකුත් කිරීම සඳහා නීති අංශය වෙත යොමුකර තිබූ ලිපිගොනු 1123 න් ලිපිගොනු 1007 ක සියලු වැඩ නිම කර ඇති ප්‍රතිලාභීන් වෙත ඔප්පු පිරිනැමීම සඳහා අදාළ දිස්ත්‍රික් කාර්යාල වෙත යොමුකර ඇත. (ඇමුණුම - 01)

2020 වර්ෂයේ නීති අංශය මඟින් මෙහෙයවන ලද නඩු පිළිබඳ විස්තර

ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ අණපනත්වලට අනුව නිවාස ණය ගෙවීම පැහැර හරින අයට, නාගරික කුලී වාරික ගෙවීම පැහැර හරින අයට ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සතු ඉඩම්වල සහ ගොඩනැගිලිවල අනවසරයෙන් රැඳී සිටින අයට එරෙහිව ජාතික නිවාස සංවර්ධන අධිකාරිය පවරනු ලබන නඩු හා ජාතික නිවාස සංවර්ධන අධිකාරියට විරුද්ධව වෙනත් පාර්ශවයන් විසින් පවරනු ලබන නඩු සඳහා අධිකරණය හමුවේ පෙනී සිටීම.

විභාග වෙමින් පවතින නඩුවලට අදාළ තොරතුරු

ප්‍රධාන කාර්යාලය

සාරාංශය (2020.12.31 දිනට ප්‍රගතිය)

අනු අංකය	නඩුවේ ස්වභාවය	නඩු සංඛ්‍යාව									එකතුව	අවසන් කර ඇති නඩු ගණන	දැනට විභාග වන නඩුවල එකතුව
		ශ්‍රේෂ්ඨාධිකරණය	මහේස්ත්‍රාත් අධිකරණය	මහාධිකරණය	වාණිජ මහාධිකරණය	දිසා අධිකරණය	අභියාචනාධිකරණය	සිවිල් අභියාචනාධිකරණය	කම්කරු විනිශ්චය සභාව	කාර්මික අධිකරණය			
1	ඉඩම් සම්බන්ධව	3					8				11	1	10
2	නිවාස ගැටළු	1		1				1			3	3	0
3	සේවයෙන් පහකිරීමට / සේවය අත්හිටුවීමට එරෙහිව	1		1			1		5	3	11	3	8
4	අර්ථසාධක ගැටළු සම්බන්ධව		1				2				3		3
5	ඉදිකිරීම් සම්බන්ධව ගැටළු				1	1	2				4	2	2
6	ස්ථානමාරුවීම් සම්බන්ධව			1			1				2		2
7	හිඟ වැටුප් ගෙවීමට අදාළ ගැටළු								1		1		1
8	මුදල් වංචා කිරීම් සම්බන්ධව												
9	සෞඛ්‍යමය ගැටළු සම්බන්ධව		1								1		1
10	ගිවිසුම් කඩකිරීම් සම්බන්ධ ගැටළු	1			2	3					6	2	4
11	බදු කුළී ගැටළු												
12	වන්දි ඉල්ලීම් සම්බන්ධව					1			1		2		2
13	අධිකරණයට අපහාස කිරීම සම්බන්ධව						1				1		1
මුළු එකතුව		**6**	**2**	**3**	**3**	**5**	**15**	**1**	**7**	**3**	45	11	34

දිස්ත්‍රික් කාර්යාල මට්ටමින් පවරා ඇති නඩු වලට අදාළ කොරතුරු
2020 දෙසැම්බර් මස 31 වන දිනට

අනු අංකය	දිස්ත්‍රික් කාර්යාලය	ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් පවරා ඇති නඩු පිළිබඳ තොරතුරු										ජාතික නිවාස සංවර්ධන අධිකාරියට එරෙහිව පවරා ඇති නඩු පිළිබඳ තොරතුරු					සම්පූර්ණ නඩු සංඛ්‍යාව
		ණය පැහැරහැරීම සම්බන්ධ නඩු		නාගරික කුළී නඩු සංඛ්‍යාව	අනවසර ඉඩම් / නිවාස / ගොඩනැගිලිවල සන්තකය ආපසු ලබාගැනීම	වෙනත් නඩු සංඛ්‍යාව (කම්කරු විනිශ්චය සභාව, මහාධිකරණය, අභියාචනාධිකරණය, ශ්‍රේෂ්ඨාධිකරණ	එකතුව	අයවිය යුතු මුදල	නීති කටයුතු තුළින් මුදල් අයකර ඇති නඩු සංඛ්‍යාව	නීති කටයුතු තුළින් අය වී ඇති මුදල	අයවිය යුතු ඉතිරි මුදල	නඩු සංඛ්‍යාවේ එකතුව				වන්දි මුදලක් ඉල්ලා ඇත්නම් එම වන්දි මුදලේ ප්‍රමාණය	
		උපහාර	විසිරි									වන්දි මුදලක් ඉල්ලා පවරා ඇති නඩු	වෙනත් නඩු	කොන්ත්‍රාත් LT නඩු	එකතුව		
1	කොළඹ	84	88	10	22	12	**216**	84,082,547.51	109	17,896,444.15	66,186,103.36	_	_	2	**2**	_	**218**
2	කොළඹ දකුණ		15	11	14	1	**41**	3,934,259.78	2	306,921.47	3,627,338.31	1	14	_	**15**	2,000,000.00	**56**
3	කොළඹ උතුර		16	7	1		**24**	64,470,440.00	4	2,592,376.00	61,878,064.00	1	2	_	**3**	600,000.00	**27**
4	කළුතර	3	1	_	2	_	**6**	1,688,125.18	2	304,104.98	1,384,020.20	1	3	1	**5**	25,000,000.00	**11**
5	ගම්පහ	26	10	_	_	_	**36**	9,096,090.53	8	371,258.00	8,724,832.53	_	_	6	**6**	_	**42**
6	කෑගල්ල	_	97	_	_	_	**97**	2,313,442.00	28	117,257.00	2,196,185.00	1	_	_	**1**	1,000,000.00	**98**
7	මහනුවර	18	104	_	1	_	**123**	7,489,124.26	19	393,233.13	7,095,891.13	1	8	17	**26**	10,000,000.00	**149**
8	මාතලේ	3	54	_	1	_	**58**	9,269,968.64	58	6,632,485.42	2,637,483.22	_	_	12	**12**	1,000,000.00	**70**
9	නුවරඑළිය	2	11	_	_	_	**13**	3,545,374.00	8	499,220.00	3,046,154.00	_	_	22	**22**	_	**35**
10	බදුල්ල	_	_	_	2	_	**2**	_	0	_	_	2	1	17	**20**	1,000,000.00	**22**
11	රත්නපුර	_	_	_	2	_	**2**	_	0	_	_	_	_	11	**11**	_	**13**
12	ගාල්ල	8	112	_	_	_	**120**	8,345,940.86	23	2,710,576.03	5,635,364.83	1	1		**2**	550,000.00	**122**
13	මාතර	24	370	_	1	2	**397**	11,508,760.09	72	3,503,055.02	8,005,705.07	_	_	730	**730**	_	**1127**
14	හම්බන්තොට	_	33	_	_	_	**33**	6,064,239.52	17	791,500.00	5,272,739.52	2	_	_	**2**	1,011,000.00	**35**
15	මොනරාගල	1	1	_	2	_	**4**	459,464.92	1	119,000.00	340,464.92	_	_	_	**0**	_	**4**
16	කුරුණෑගල	_	2	_	1	_	**3**	156,420.00	2	65,000.00	91,420.00	_	3	_	**3**	_	**6**
17	පුත්තලම	_	21	_	1	_	**22**	1,232,890.00	5	508,900.00	723,990.00	_	_	_	**0**	_	**22**
18	අනුරාධපුර	_	_	_	_	_	**0**	_	_	_	_	_	4	19	**23**	_	**23**
19	පොලොන්නරුව	1	2	_	_	_	**3**	452,278.00	3	203,450.00	248,828.00	_	_	_	**0**	_	**3**
20	ත්‍රිකුණාමලය	_	_	_	_	_	**0**	_	_	_	_	_	_	_	**0**	_	_
21	වව්නියාව	_	_	_	_	_	**0**	_	_	_	_	_	_	_	**0**	_	_
22	අම්පාර	_	_	_	_	_	**0**	_	_	_	_	_	_	37	**37**	_	**37**
23	මඩකළපුව	_	_	_	_	_	**0**	_	_	_	_	_	_	_	**0**	_	_
24	මන්නාරම	_	_	_	_	_	**0**	_	_	_	_	_	_	_	**0**	_	_
25	කිළිනොච්චිය	_	_	_	_	_	**0**	_	_	_	_	_	_	_	**0**	_	_
26	මුලතිව්	_	_	_	_	_	**0**	_	_	_	_	_	_	_	**0**	_	_
27	යාපනය	3	67	_	_	_	**70**	6,678,820.56	_	2,596,460.27	4,082,360.29	_	_	_	**0**	_	_
	එකතුව	173	1004	28	50	15	**1270**	**220,788,185.85**	**361**	**39,611,241.47**	**181,176,944.38**	10	36	874	**920**	**42,161,000.00**	**2120**

සැලසුම් හා ප්‍රගති කොට්ඨාශය

තිරසර සංවර්ධන අරමුණු ඉටුකර ගනිමින් පවත්නා රජයේ ප්‍රතිපත්ති වලට අනුව ඉදිරිපස් අවුරුදු කාල සීමාව තුල ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ අරමුණු හා අරමුණු ඉටුකර ගැනීම සඳහා අනුගමනය කිරීමට බලාපොරොත්තු වන උපාය මාර්ග, සැලසුම් හා ඉලක්ක ඇතුලත් සංයුක්ත සැලැස්ම සැකසීම, මධ්‍යකාලීන සැලැස්ම අනුව වැඩසටහන්, ව්‍යාපෘති හා ක්‍රියාකාරකම් වලට අදාල භෞතික හා මූල්‍ය ඉලක්ක ඇතුලත් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සැකසීමත්, වර්ෂය ආරම්භ වීමට පෙර සිදුකරනු ලබයි.

සකස් කළ ක්‍රියාකාරී සැලැස්මේ වැඩසටහන් හා ඉලක්ක දිස්ත්‍රික් කාර්යාල මඟින් ක්‍රියාවට නැංවීමේ ප්‍රගතිය සෑම මාසයක් අවසානයේම ලබාගෙන ඉලක්ක කරා ළඟාවීමේ ප්‍රගතිය හා ඉලක්ක සපුරා නොගත් අවස්ථා පිළිබඳ ඉහළ කළමනාකාරීත්වය වෙත හා අමාත්‍යාංශය, භාණ්ඩාගාරය ඇතුළු භාහිර පාර්ශව වෙත වාර්තා කිරීම මෙම කොට්ඨාසය මඟින් සිදුකරනු ලබයි. එසේම වර්ෂය තුළ ආයතනයේ ක්‍රියාකාරීත්වය, ඉටුකළ කාර්යභාරය ඇතුලත් වාර්ෂික වාර්තාව, මහ බැංකු වාර්තාව සඳහා ආයතනයේ මෙහෙයුම් කටයුතු පිළිබඳ තොරතුරු ලබාදීම, අයවැය විවාද අවස්ථාව සඳහා අවශ්‍ය තොරතුරු පාර්ලිමේන්තුව, අමාත්‍යාංශය හා ඉහළ කළමනාකාරීත්වය වෙත ලබාදීම සිදුකරනු ලබයි.

මීට අමතරව ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් විසින් අසනු ලබන වාචික ප්‍රශ්ණ සඳහා පිළිතුරු ලබාදීම, ආංශික අධීක්ෂණ කමිටු රැස්වීම්වලදී පැන නැගෙන ප්‍රශ්ණවලට පිළිතුරු ලබාදීමත් මෙම කොට්ඨාසය මඟින් කරනු ලබන රාජකාරි අතර වේ.

සෙවණ ලොතරැයි අලෙවි ප්‍රවර්ධනය කිරීම සඳහා ජාතික ලොතරැයි මණ්ඩලය සමඟ සම්බන්ධීකරණය කරමින් අවශ්‍ය පියවර ගැනීම සිදුකරන අතර, සෙවණ අරමුදලට ලැබෙන අරමුදල් යෙදවීම සඳහා අරමුදල් ලබාගැනීමට සෙවණ පාලක මණ්ඩලය කැඳවීම හා අදාළ පාලක මණ්ඩල පත්‍රිකා අදාළ කොට්ඨාස වෙතින් ලබාගෙන පාලක මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම මෙම කොට්ඨාසය මඟින් සිදුකෙරේ. පැවති Kovid 19 වසංගත තත්වය තුල වුවද වර්ෂය තුල සෙවණ පාලක මණ්ඩල රැස්වීම් වාර 01 ක් පවත්වා ඇත.

ඉදිරි වර්ෂ සඳහා අයවැය ප්‍රතිපාදන වෙන්කරවා ගැනීම සඳහා වැඩසටහන්, ඇස්තමේන්තු හා ව්‍යාපෘති යෝජනා සකස්කර සැලසුම් දෙපාර්තමේන්තුව හා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කිරීම මෙම කොට්ඨාසය මඟින් වාර්ෂිකව සිදුකරනු ලබන රාජකාරි අතර වේ. ඒ අනුව 2020 වර්ෂය තුල ආයතනය වෙත ලැබුණු ඉහළම භාණ්ඩාගාර අරමුදල් ප්‍රමාණය එනම්, රු.මි. 5644.423 ලබා ගැනීමට හැකි විය. මෙම අරමුදල් මඟින් අඩු ආදායම්ලාභී නිවාස ආධාර වැඩ සටහන සඳහා ප්‍රමුඛතාව දී තිබීමද විශේෂත්වයකි. එසේම සැලකිය යුතු අරමුදල් ප්‍රමාණයක් නව නිවාස හා වැඩි දියුණු නිවාස වැඩ සටහන වෙනුවෙන් ණය ලබාදීම සඳහාද යොදා ගෙන ඇත.

මීට අමතරව 1919 රාජ්‍ය තොරතුරු කේන්ද්‍රය සඳහා ආයතනයට අදාළ තොරතුරු ලබාදෙමින් එම තොරතුරු යාවත්කාලීන කිරීම හා රජයෙන් තෝරාගත් තාක්ෂණ නියෝජිත ආයතනය සමඟ සම්බන්ධීකරණය මෙම කොට්ඨාසය මඟින් ඉටුකළ රාජකාරි අතර වේ.

ජනතාවගේ තොරතුරු දැනගැනීමේ අයිතිය තහවුරු කිරීම.

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ පනත අනුව ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ මෙහෙයුම් කටයුතු හා එහි ක්‍රියාකාරීත්වය පිළිබඳ ශ්‍රී ලාංකීය ප්‍රජාව විසින් විමසනු ලබන තොරතුරු ලබාදීමේ තොරතුරු නිලධාරී ලෙස සැලසුම් හා ප්‍රගති කොට්ඨාසයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී කටයුතු කරනු ලබයි. ඒ අනුව 2020 වර්ෂය තුල මහජන ඉල්ලීම් හා ඒ සඳහා කටයුතු කළ ආකාරය පහත පරිදි වේ.

2020 වර්ෂය

මුළු ඉල්ලීම් ගණන	-	47
පිළිතුරු ලබාදුන් ගණන	-	35
අභියාචනා සඳහා ඉදිරිපත් වූ ඉල්ලීම් ගණන	-	03

සැපයුම් අංශය

සැපයුම් අංශය මෙම කොට්ඨාශය යටතේ පරිපාලනය වන අතර, ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ ප්‍රධාන කාර්යාලය සඳහා අවශ්‍ය සැපයුම් සියල්ල මෙන්ම දිස්ත්‍රික් කාර්යාල සඳහා අවශ්‍ය ස්ථාවර වත්කම් වලින් වැඩි කොටසක් සැපයීම සැපයුම් අංශය මගින් සිදු කරන ලදි.

සංචාරක බංගලා

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සතුව දැනට සක්‍රීය සංචාරක බංගලා 10 ක් පවතින අතර, එම සියලු සංචාරක බංගලා නඩත්තු කිරීම හා පවත්වාගෙන යාමත්, සංචාරක බංගලා පාරිභෝගිකයින් වෙත වෙන්කිරීමේ කටයුතුත් මෙම අංශය මගින් සිදු කරනු ලබයි.

ඊට අතිරේකව සෙවණ මාධ්‍ය ඒකකය හා ආයතනයේ මුද්‍රණ කටයුතු සිදු කරනු ලබන මුද්‍රණාලයද සැලසුම් හා ප්‍රගති කොට්ඨාශයේ පාලනය යටතේ පවතී. සෙවණ මාධ්‍ය ඒකකය මගින් අප අධිකාරියේ ඇතුලු රාජ්‍ය ආයතන වෙතින් මාධ්‍ය වෙත පලකරනු ලබන වෙළඳ දැන්වීම් මගින් අතිරේක ආදායමක් ආයතනය වෙත ලබා ගැනීම සිදු කරනු ලබයි. එසේම මුද්‍රණාලය මගින් ආයතනික මුද්‍රණ කටයුතු වලින් සැලකිය යුතු ප්‍රමාණයක් සිදු කරනු ලබයි.

සෙවණ මාධ්‍ය ඒකකය

- 2020 වසරේදී සෙවණ මාධ්‍ය සේවය විසින් ග්‍රාමීය නිවාස, ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය, රජයේ කර්මාන්ත ශාලාව, රාජ්‍ය සංවර්ධන නිර්මාණ නීතිගත සංස්ථාව, සී/ස ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව, ගොඩනැගිලි දෙපාර්තමේන්තුව සහ මධ්‍ය ආදායම් නිවාස හා යටිතල පහසුකම් සංවර්ධනය සඳහා වන කඩිනම් වැඩසටහන ඇතුළු ආයතනවල විවිධ පුවත්පත් දැන්වීම් පළකිරීම සිදු කරන ලදී.


- 2020 වසරේදී සෙවණ මාධ්‍ය සේවයෙහි වාර්ෂික ඇස්තමේන්තුගත ලාභය රු. මිලියන 6.0 කි. 2020 දෙසැම්බර් දක්වා ලැබූ ආදායම රු. මිලියන 8.612 ක් වන අතර ලාභය රු. මිලියන 1.190 කි.
- සෙවණ මාධ්‍ය සේවයේ සියලු ඉපැයීම් “සභාපති, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය” නමින් වූ වෙනම ගිණුමකට බැරකරනු ලබන අතර, මෙම අරමුදල් ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ නිවාස සංවර්ධන වැඩසටහන් සඳහා යොදාගනු ලැබේ.

පුවත්පත් දැන්වීම්

2020 ජනවාරි සිට දෙසැම්බර් දක්වා ආදායම් සහ ලාභ

මාසය	ආදායම රු.	ලාභය රු.
ජනවාරි	841,843.80	114,017.25
පෙබරවාරි	475,632.00	61,808.64
මාර්තු	318,824.70	44,778.75
අප්‍රේල්	-	-
මැයි	-	-
ජූනි	387,897.60	54,480.00
ජූලි	727,089.06	100,479.00
අගෝස්තු	894,690.30	121,558.13
සැප්තැම්බර්	979,799.22	137,612.25
ඔක්තෝබර්	2,000,495.40	277,282.50
නොවැම්බර්	1,502,353.26	210,741.75
දෙසැම්බර්	483,537.00	67,912.50
එකතුව	**8,612,162.34**	**1,190,670.77**

2020 වර්ෂය සඳහා ආදායම් ඉලක්කය - රු. මි. 6.0



ජාතික නිවාස සංවර්ධන අධිකාරිය
නිවාස සංවර්ධන වැඩ සටහන - 2020.12.31 දිනට කාර්යය සාධනය

නිවාස වැඩ සටහන	වාර්ෂික ඉලක්ක			ලගාවීම		
	භෞතික		මුල්‍ය (රු. මි.)	භෞතික		මුල්‍ය (රු. මි.)
	ආරම්භ කිරීම	නිම කිරීම		ආරම්භ කිරීම	නිම කිරීම	
භාණ්ඩාගාර අරමුදල්						
1 අඩු ආදායම්ලාභින් සඳහා නිවාස ඉදිකිරීම්						
ඔබට ගෙයක් රටට හෙටක් (ආධාර)	10000	5000	5271.500	9972	3949	4777.057
ඔබට ගෙයක් රටට හෙටක් (ණය)	2500	2500	810.000	1852	500	544.837
2 අවිච්ඡේද වැඩ සටහන						
වසන්තන්පුරම් නිවාස වැඩ සටහන		52			39	32.300
පාස්කු ප්‍රහාරයෙන් විපතට පත්අය සඳහා නිවාස ඉදිකිරීම		196			116	46.469
ආදර්ශ ගම්මාන සඳහා ගොඩනැගිලි ද්‍රව්‍ය මිලට ගැනීම		2866			2866	122.667
3 නිවාස ආශ්‍රිත සහායක සේවා						
පාලම් ඉදිකිරීම සඳහා හිග බිල්පත් නිරවුල් කිරීම		පාලම් 27 ක ඉදිකිරීම් නිම කිරීම	99.000		පාලම් 27 ක ඉදිකිරීම් නිම කිරීම	99.000
අභ්‍යන්තර උත්පාදන හා වෙනත් - උප එකතුව	**12500**	**10614**	**6384.047**	**11824**	**7470**	**5622.333**
අභ්‍යන්තර අරමුදල්						
4 ඔබට ගෙයක් රටට හෙටක් (ණය)	1675	1675	600.000	495	73	93.625
ඉන්දියන් ආධාර නිවාස (අවිච්ඡේද)		1967			520	34.71
බාහිර - උප එකතුව	**1675**	**3642**	**600.000**	**495**	**593**	**128.335**
එකතුව	**14175**	**14256**	**6984.047**	**12319**	**8063**	**5750.665**
ඔප්පු නිකුත් කිරීම		3000			1007	

තොරතුරු හා ප්‍රචාරක කොට්ඨාශය

ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ නිවාස වැඩ සටහන සඳහා සහභාගීවන නිවාස හිමියන්ගේ සන්නිවේදන අවශ්‍යතා සපුරාලීම සඳහා තොරතුරු හා ප්‍රචාරක අංශය 2020 වසරෙදී විවිධ මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය වැඩ සටහන් ක්‍රියාත්මක කරන ලදි.

2020 වසරේදී තොරතුරු හා ප්‍රචාරක අංශය පහත සඳහන් වැඩ සටහන්ද ක්‍රියාත්මක කරන ලදි.

- ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් ක්‍රියාත්මක කරන ලද ඔබට ගෙයක් රටට හෙටක් ජාතික නිවාස වැඩ සටහනට අදාළ මාධ්‍ය ආවරණ කටයුතු හා මුද්‍රිත මාධ්‍ය තුළින් මහජනතාව දැනුවත් කිරීම.

- ඔබට ගෙයක් රටට හෙටක් ජාතික නිවාස වැඩ සටහන යටතේ 2020 අවුරුද්ද තුල පහත සඳහන් කාර්යයන්ද තොරතුරු හා ප්‍රචාරක අංශය මගින් සිදු කරන ලදි.

1. ඔබට ගෙයක් - රටට හෙටක් වැඩ සටහන යටතේ නිවාස ජනතා අයිතියට පත්කරනු ලබන උත්සව පිළිබඳව අවශ්‍ය තොරතුරු ලබා ගැනීම සහ එම අවස්ථා ඡායාරූප හා විඩියෝ ගත කිරීම සහ අධිකාරියේ අනෙකුත් උත්සව ඡායාරූප හා විඩියෝගත කිරීම.

2. ප්‍රචාරක කටයුතු වලට අදාළ දිස්ත්‍රික් කාර්යාල සම්බන්ධීකරණය කිරීම.

3. සියලුම දිස්ත්‍රික් කාර්යාලවල සහ ප්‍රධාන කාර්යාලයේ ලිපිලේඛන භාෂා තුනෙන්ම පරිවර්තනය කිරීම.

4. බැනර්, ලෝගෝ, සහතික පත් ආදි අවශ්‍ය ලිපි ලේඛන වල පෙර මුද්‍රණ චිත්‍ර සටහන් සකස් කිරීම සහ එම අවශ්‍යතාවයන් සඳහා දිස්ත්‍රික් කාර්යාල සම්බන්ධීකරණය කිරීම.

5. එදිනෙදා පුවත්පත්හි පල වී ඇති (අධිකාරිය හා අමාත්‍යාංශය සම්බන්ධව) නිවාස කටයුතු සම්බන්ධයෙන් පළවී ඇති ප්‍රවෘත්ති කැපීමේ කටයුතු සහ එකී ලිපි ඉහළ කළමනාකාරිත්වය වෙත යොමු කිරීම හා වැරදී ලෙස පල කරන ලද ප්‍රවෘත්ති එම ආයතනය මගින් නිවරදි කරවීම.

